# සීමා බිඳ තොරතුරු වෙත

## ශ්‍රී ලංකාවේ තොරතුරු දැන ගැනීමේ යාන්ත්‍රණයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ අධ්‍යයන වාර්තාව

RIGHT TO LIFE HUMAN RIGHTS CENTER

# සීමා බිඳ තොරතුරු වෙත

## ශ්‍රී ලංකාවේ තොරතුරු දැන ගැනීමේ යාන්ත්‍රණයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ අධ්‍යයන වාර්තාව


RIGHT TO LIFE
HUMAN RIGHTS CENTRE

රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය

2023 ජූනි

රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය

2023 මැයි

දායකත්වය

රචනය : සුනෙත් ගජනායක

සංස්කරණය : නිතීඥ දුලාන් දසනායක

ප්‍රකාශනය : රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය

මුද්‍රණය : ඩිසයින් සිස්ටම්ස් (පුද්) සමාගම

ව්‍යාපෘති කළමනාකරණය : දිනිති සුපේක්ෂලා

# පටුන


පෙරවදන ..................... 5

හැඳින්වීම ..................... 7

අධ්‍යයනයේ අරමුණු ..................... 7

අධ්‍යයනයේ සීමාවන් ..................... 8

අධ්‍යයන ක්‍රමවේදය ..................... 8

1. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ ගමන් මඟ ..................... 9

2. තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය ..................... 11

3. 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ..................... 12

4. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ..................... 14

4.1 කොමිෂන් සභාවේ රාජකාරි, කාර්යයන් සහ බලතල ..................... 15

4.1.1 තොරතුරු කොමිෂන් සභාවේ කාර්යය සහ කර්තව්‍යයන් (14 වගන්තිය) ..................... 15

4.1.2 පනතේ දක්වා ඇති පරිදි කොමිෂන් සභාවේ බලතල ..................... 15

5. තොරතුරු දැන ගැනීමේ යාන්ත්‍රණය ..................... 17

5.1 තොරතුරු ඉල්ලුම් කිරීම ..................... 17

5.2 අභියාචනා පටිපාටිය ..................... 18

5.3 කොමිසමට අභියාචනා යොමු කිරීම ..................... 19

6. තොරතුරු දැන ගැනීමේ අයිතියට රාජ්‍ය අධිකාරීන් බාධා කිරීම හා එකී බාධාවන් වැළැක්වීමට තොරතුරු දැන ගැනීමේ කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය ..................... 20

7. තොරතුරු කොමිසම විසින් ලබා දෙන නිර්දේශයන් ක්‍රියාත්මක වීම ..................... 24

8. විශ්ලේෂණය - 2018 සිට 2022 වර්ෂය දක්වා තොරතුරු දැන ගැනීමේ යාන්ත්‍රණයේ සහ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය ..................... 28

8.1 2018, 2019, 2020, 2021 වර්ෂයන් වල තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වූ අභියාචනා ප්‍රමාණය ..................... 28

8.2 අසා අවසන් කරන ලද සහ කල් දැමූ අභියාචනා ගණන ..................... 28

8.3 කොමිසමේ විනිශ්චය ..................... 29

8.4 2021.12.20 වනදා සිට 2022.12.31 වනදා දක්වා කොමිෂන් සභාවේ අභියාචනා විභාගය පිළිබඳ සංඛ්‍යා ලේඛනය ........ 29

8.5 2022 වර්ෂයේ කොමිෂන් සභාවේ අභියාචනා විභාගය ........ 30

8.6 2022 වර්ෂයේ මැයි මස සිට 2023 වර්ෂයේ පෙබරවාරි මස දක්වා මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථාන හරහා දිස්ත්‍රික්ක අනුව තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පනත යටතේ සිදු කළ තොරතුරු ඉල්ලීම් සහ අභියාචනා ........ 31

සමාප්තිය සහ නිර්දේශ ........ 35

ආශ්‍රිත මූලාශ්‍ර නාමාවලිය ........ 37

ඇමුණුම් ........ 39

# පෙරවදන

පසුගිය දශකය දෙස ආපසු හැරී බැලීමේ දී ශ්‍රී ලංකාවට ඉතා අවශ්‍යව තිබූ නව නීති කිහිපයක් අපගේ නීති පද්ධතියට ඇතුළත් විය. එහි ගෞරවය යහපාලන රජයක් බිහිකර ගැනීම සඳහා කැපවීම් කළ සිවිල් සමාජ ව්‍යාපාරයටත්, 2015-2018 යහපාලන රජයටත් හිමි විය යුතුය.

යහපාලන රජය විසින් ගෙන එනු ලැබූ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින්, 18 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් බලරහිත කර තිබූ ස්වාධීන කොමිෂන් සභා යාන්ත්‍රණය යළි ශක්තිමත් කිරීමටත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය තොරතුරු දැන ගැනීමේ අයිතිය 14(අ) 2015 වසරේ සිට මූලික අයිතිවාසිකම් අතරට එක්කර ගැනීමට හැකි වීම ජයග්‍රහණයක් ලෙස සැලකිය හැක.

ඊට අමතරව, යහපාලන රාජ්‍ය සමයේ තවත් නීති රාශියක් අපගේ නීති පද්ධතිය තුළට එක්කාසු කර ගැනීමට හැකි විය. ඒ අතරින් පහත සඳහන් නීති අපගේ නීති පද්ධතියට එකතුවීම හේතුවෙන් සැලකිය යුතු සමාජ අවධානයක් ලබා ගැනීමට ඉන් හැකි විය.

1. 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත
2. 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත
3. 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත
4. 2017 අංක 26 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත
5. 2018 අංක 05 දරන බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියළු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත
6. 2018 අංක 34 දරන හානිපූර්ණය සඳහා වන කාර්යාල පනත

ඉහත නව නීති අතරින් ඉතා ජනප්‍රිය, අනෙක් නීතීන්ට සාපේක්ෂව රටේ ජනතාවගේ සක්‍රීය භාවිතයට හුරුවෙමින් පවතින ප්‍රතිඵලදායක පනතක් ලෙස 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත හැඳින්විය හැක. පුරවැසියන් විසින් මෙම පනත යටතේ තොරතුරු ඉල්ලීමට හුරුවීම හේතුවෙන්, ඊට අදාල ක්ෂේත්‍රයන් හි පවතින දූෂණ හා අක්‍රමිකතා ආරම්භයේ සිටම යම් ප්‍රතිශතයකින් අඩු වෙමින් පවතින බව අප වෙත වාර්තා වී ඇත. රජයේ සෑම අංශයක් තුළම තොරතුරු නිලධාරියෙකු පත්කිරීමත්, අදාල කාල සීමාව තුළ ඔහු විසින් ඉල්ලුම්කරුට ප්‍රතිචාර දැක්වීමත් හේතුවෙන් මෙම ක්‍රියාවලියේ සැලකිය යුතු ප්‍රගතියක් මේ වන විට අත්කරගෙන තිබේ.

එමෙන්ම, කිසිදු තොරතුරක් ලබා ගැනීමට නොහැකිව තිබූ, විශේෂයෙන් පාර්ලිමේන්තුව, පොලීසිය, බන්ධනාගාරය, නීතිපති දෙපාර්තමේන්තුව වැනි ආයතන තුළින් පවා තොරතුරු ඉල්ලා සිටීමට මිනිසුන් පෙළඹීම මෙම පනතේ ඇති සුවිශේෂත්වයක් ලෙස සැලකිය හැක. පුරවැසියන් නිවැරදි තොරතුරු මත ක්‍රියාත්මක වීම, රටේ සංවර්ධනයටත්, මානව හිමිකම් ඇතුළු ප්‍රජාතන්ත්‍රීය අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට හේතු වන අතර, ඉන් නිරෝගී සමාජයක් ගොඩ නැගීමට අවශ්‍ය පසුබිම සැකසෙනු ඇති බවට අපගේ විශ්වාසයයි.

විශේෂයෙන් සිවිල් සංවිධාන, මාධ්‍යවේදීන්, ඇතුළු මානව හිමිකම් ආරක්ෂකයින් මේ සම්බන්ධව දක්වන උනන්දුවත්, ඔවුන් විසින් මෙම පනත පිළිබඳව ලබාදෙන අවබෝධය හා ප්‍රචාරයත්, අදාල වින්දිතයින් මෙම ක්‍රියාවලියට යොමු කරමින් ලබා දෙන සේවයත් නොවන්නට මෙතරම් සාර්ථකත්වයක් ළඟා කර ගැනීමට නොහැකි වීමට ඉඩ තිබුණි.

එමෙන්ම, මේ පිළිබඳව විශාල අවබෝධයක් හා කැපවීමක් සහිත කොමසාරිස්වරු තොරතුරු කොමිසමට පත්වීමත් ඔවුන්ගේ වගකීම් නිසි අයුරින් ඉටු කිරීමට කටයුතු කිරීමත් මෙම ක්‍රියාවලිය තවත් ශක්තිමත් වීමට ප්‍රධාන හේතුවක් වූ බවද මෙහි දී සඳහන් කළ යුතුය.

තොරතුරු නීතිය ක්‍රියාත්මක රටවල් 128ක් තුළින්, අපේ තොරතුරු නීතිය ගුණාත්මකභාවය අතින් හතරවන ඉහළ ස්ථානයේ බවද වාර්තා වේ. එය සත්‍යයක් නම් මෙම ශක්තිමත් නීතියෙන් අපිට තව සෑහෙන්න වැඩ ගත හැකිය. ඒ සඳහා මේ නීතිය භාවිතා කරන ජන තීරුව තවත් විශාල කරමින්, මෙම නීතිය ක්‍රියාත්මක වීමේ දී මතුවන ප්‍රායෝගික ගැටළු විසඳා ගනිමින් අප ඉදිරියට යා යුතුය.

තොරතුරු කොමිසම හා එහි ක්‍රියාකාරීත්වයත් සම්බන්ධව අවබෝධයක් ලබා ගැනීම සඳහාත්, එම කොමිසම සමඟ සෘජුවම කටයුතු කරනු ලැබූ අපගේ මානව හිමිකම් ආරක්ෂකයින් ගේ ජීවමාන අත්දැකීම් ද ගොනු කරමින් මෙම අධ්‍යයන වාර්තාව සකස් කරනු ලැබූවේ අප සමඟ කටයුතු කරනු ලබන මානව හිමිකම් ආරක්ෂකයින්ගේ ප්‍රයෝජනය සඳහාය.

මෙම ප්‍රකාශනය සැකසීම සඳහා නන් අයුරින් දායක වූ අපගේ මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථාන සම්බන්ධීකාරකවරුන්, තොරතුරු පනත භාවිතා කරමින් එහි අත්දැකීම් සමාජ ගත කිරීම සඳහා දායක වූ සැමටත්, මෙම අධ්‍යයනය සිදු කල සුනෙත් ගජනායක මහතාටත් මෙහි දී මාගේ විශේෂ ස්තුතිය පුදකර සිටිමි.

**පිලිප් දිසානායක**
විධායක අධ්‍යක්ෂක,
රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය

15/06/2023

# හැඳින්වීම

තොරතුරු දැන ගැනීමේ අයිතිය ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පයෙන් වෙන් කල නොහැකි අයිතිවාසිකමක් ලෙස වත්මන් සන්දර්භය තුළ පෙන්වා දිය හැක්කේ එය රාජ්‍යක යහපාලනය, විනිවිදභාවය, රාජ්‍ය නිලධාරීන්ගේ වගවීම වැනි අත්‍යවශ්‍ය ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් සුරක්ෂිත කරන නිසාවෙනි. 19 වන සියවසේ අග භාගය වන විට ලෝකයේ බොහෝ රටවල් මෙම තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම තහවුරු කිරීමට ඔවුන්ගේ නිතී පද්ධතිය තුළට විවිධ අන පනත් මගින් බොහෝ හරාත්මක නීතින් ගෙන එන ලදි. ඒ ආකාරයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් 2016 අගෝස්තු මස 4 වන දින සහතික කොට 2016 අගෝස්තු 5 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ දෙවන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලද 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ශ්‍රී ලංකාවේ තොරතුරු දැන ගැනීමේ අයිතිය තහවුරු කිරීමේ ධනාත්මක ප්‍රජාතන්ත්‍රීය පියවරක් ලෙස සැලකිය හැකිය. මන්දයත් 19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (අ) ව්‍යවස්ථාව මගින් තොරතුරු කරා ප්‍රවේශවීමේ අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස සහතික කොට එම අයිතිය බලාත්මක කිරීම මගින් පොදු අධිකාරීන් වල විනිවිදභාවය සහ වගකීම පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීම හරහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට යහපාලනය සඳහා වැඩි වශයෙන් සහභාගී විය හැකි වටපිටාව නිර්මාණය වීම හේතුවෙනි.

2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතින් ඊට අදාළ හරාත්මක නීති තවදුරටත් විස්තරාත්මක කාර්යපටිපාටියකට දක්වා ඇති අතර ඊට අනුකූලව පුරවැසියන්ට තොරතුරු කරා ලඟා වීමටත්, පොදු අධිකාරීන් එම තොරතුරු ලබා දිය යුත්තේ කෙසේ ද යන්නටත් ඉතා හොඳ මාර්ගෝපදේශයක් සපයයි. මෙම ක්‍රියාවලිය පසුගිය වසර 6 පුරාවට විවිධ අඩුලුහුඩුකම් සහ සාධනීය ලක්ෂණයන් සමග ක්‍රියාත්මක වූ අතර අද වන විට එම ක්‍රියාවලියේ අඩුලුහුඩුකම්, ප්‍රවණතා සහ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වර්ධනය කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ අධ්‍යයන කිරීම කාලීන අවශ්‍යතාවයක් බව පෙනී ගියේ ය. එම අවශ්‍යතාව මූලික කර ගනිමින් ශ්‍රී ලංකාවේ තොරතුරු දැන ගැනීමේ යාන්ත්‍රණය පිළිබඳ මෙම අධ්‍යයනය සිදු කෙරිණි. මෙහි දී මූලික වශයෙන් තොරතුරු දැන ගැනීමේ පනතේ පසු බිමත්, එම යාන්ත්‍රණයේ සහ කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳවත් අවධානය යොමු කර ඇත. එහිදි අපගේ මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථානවල පූර්ණ දායකත්වය මෙම අධ්‍යයන සඳහා ලබා ගන්නා ලදි.

දිස්ත්‍රික්ක 8 ක් පුරා විසිරි ඇති මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථාන හරහා විවිධ පොදු අධිකාරීන් වෙත යොමු කල තොරතුරු ඉල්ලීම් මත පදනම්ව තොරතුරු දැන ගැනීමේ යාන්ත්‍රණයේ ක්‍රියාකාරිත්වය, කාර්යක්ෂමතාවය, රාජ්‍ය නිලධාරියාගේ දැනුවත්භාවය, යාන්ත්‍රණයේ ප්‍රායෝගික ගැටලු, පුරවැසි දැනුවත්භාවය සහ වත්මන් සාධනීය ලක්ෂණ මෙහි දි ඉස්මතු කර ඇත. ඒ හරහා තොරතුරු යාන්ත්‍රණයේ ප්‍රායෝගික භාවිතය වර්ධනය කිරීමත්, අඩුලුහුඩුකම් අවම කර ගැනීමත්, පුරවැසි දැනුවත්භාවය සහ අවබෝධය වැඩි දියුණු කිරීමත්, තොරතුරු අයිතිය සනාථ කිරීමට රාජ්‍ය නිලධාරීන්ගේ අවධානය සහ අවබෝධය ඉහළ නැංවීම සඳහා යෝජනා සහ නිර්දේශයන් ඉදිරිපත් කිරීම පිළිබඳ මෙහි දි අවධානය යොමු කර ඇත.

## අධ්‍යයනයේ අරමුණු

මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය වන්නේ 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත මගින් දක්වා ඇති ක්‍රියාපටිපාටියේ වත්මන් ක්‍රියාකාරිත්වය විශ්ලේෂණය සහ අධ්‍යයන කිරීමත්, අඩුලුහුඩුකම් හඳුනාගනිමින් තොරතුරු දැන ගැනීමේ අයිතිය ශක්තිමත් කිරීමට නිර්දේශ ඉදිරිපත් කිරීමත්

ය. එමෙන්ම හඳුනාගනු ලබන සාධනීය ලක්ෂණ අගය කිරීම, තොරතුරු ඉල්ලීම් යොමු කිරීමේ දී පුරවැසියන් හට මුහුණපෑමට සිදුවන ප්‍රායෝගික ගැටලු ඉස්මතු කිරීම සහ තොරතුරු දැන ගැනීමේ යාන්ත්‍රණයේ නියැලී සිටින පොදු අධිකාරීන් හි නිලධාරීන්ගේ අවබෝධය සහ දැනුවත්භාවය පිළිබඳ කරුණු අධ්‍යයනය කිරීමට අපේක්ෂිත ය.

## අධ්‍යයනයේ සීමාවන්

මෙහිදී අප විසින් තොරතුරු ඉල්ලීම් පොදු අධිකාරීන්ට යොමු කරමින් එහි ප්‍රතිඵලය කුමක් ද යන්න පිළිබඳ අධ්‍යනය කළ අතර ම තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා විසින් නිකුත් කරන ලද කාර්ය සාධන වාර්තාවල දත්තයන් ද ද්විතීයික දත්තයන් ලෙස විශ්ලේෂණය සඳහා භාවිතා කෙරිණි. ඒ අනුව මෙම අධ්‍යනයේ දී හුදෙක් අදාළ පොදු අධිකාරීන් මූලික අවස්ථාවේ ක්‍රියා කරන ආකාරය අධ්‍යනය කළ අතර ම ප්‍රථම තොරතුරු ඉල්ලුම් කිරීමේ සිට ඉන් අනතුරුව නම් කල නිලධාරියා වෙත අභියාචනා යොමු කිරීම සහ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනා කිරීමේ ක්‍රියා පටිපාටිය දක්වා ම මෙම අධ්‍යයන ව්‍යාප්ත වන බව සඳහන් කළ යුතුය.

අධ්‍යයනය සිදු කිරීමේදී අප මුහුණ දුන් ප්‍රධාන ගැටලුව වන්නේ අපගේ මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථාන හරහා තොරතුරු ඉල්ලුම්පත් යොමු කල ඇතැම් පාර්ශවයන්ගෙන් එම තොරතුරු ඉල්ලීම පිළිබඳ වත්මන් තත්වය විමසීම සඳහා අපගේ දිස්ත්‍රික් සම්බන්ධීකාරවරුන්ට සම්බන්ධ කර ගැනීමට නො හැකි වීමයි. ඒ හරහා තොරතුරු ඉල්ලීම් කිහිපයකම නිරවද්‍ය තොරතුරු ලබා ගැනීමට අපට නො හැකි විය.

එමෙන්ම තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ 2022 ජනවාරි මස සිට 2023 පෙබරවාරි මස දක්වා පැමිණි අභියාචනා, විමර්ශන සහ නිර්දේශ සම්බන්ධයෙන් තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිසම වෙත තොරතුරු ඉල්ලුම්පතක් යොමු කළ ද, එයට මෙතෙක් කිසිදු ප්‍රතිචාරයක් නො ලැබිණ. ඉන් පසුව තොරතුරු දැන ගැනීමේ ක්‍රියාපටිපාටියට අනුකූලව කොමිසමේ නම් කල නිලධාරියා වෙතද අභියාචනයක් යොමු කල ද එයට ද මෙතෙක් කිසිදු ප්‍රතිචාරයක් නො ලැබිණි. එනිසා අධ්‍යයනයේදී තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තා සහ කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ඇති වෙනත් ලියකියවිලි මත රඳා පැවතීමට අපට සිදුවිය.

## අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේදී යොදා ගනු ලැබූ ක්‍රමවේදය වූයේ තොරතුරු දැන ගැනීමේ යාන්ත්‍රණය තුළ ක්‍රියාකාරී වූ පුද්ගලයන් සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡා ඇසුරෙන් එක්රැස් කරගන්නා ලද තොරතුරු, මාධ්‍ය වාර්තා, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සහ ඊට සබැඳි ගැසට් පත්‍ර, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිසමේ කාර්ය සාධන වර්තාවන්, පුවත්පත් ලිපි, සහ මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථානය හරහා තොරතුරු දැන ගැනීමේ පනතට අනුව පොදු අධිකාරීන් වෙත යොමු කළ තොරතුරු ඉල්ලුම්පත් හරහා ලබා ගන්නා ලද තොරතුරු ඒකරාශි කර ඒවා පුළුල් වාර්තාවක් තුළ සංස්ලේෂණය කර ඉන් අනතුරුව විශ්ලේෂණය කිරීමයි. එහි දී ප්‍රාථමික දත්ත වශයෙන්, සම්මුඛ සාකච්ඡා සහ මොණරාගල, මාතර, ගාල්ල, පුත්තලම, ගම්පහ, කුරුණෑගල, ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කයන් පුරා විහිදී ඇති මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථාන හරහා ජනතාව පොදු අධිකාරීන් වෙත 2022 මැයි මස සිට 2023 පෙබරවාරි මස දක්වා යොමු කළ තොරතුරු ඉල්ලුම්පත් 75 ක් මෙම අධ්‍යයනයට මූලික වශයෙන් පදනම් කොටගෙන ඇත. එසේම මෙම වාර්තාවේ සොයා ගැනීම් ඉදිරිපත් කිරීම සඳහා පුවත් පත් ලිපි, මාධ්‍ය වර්තාව, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ කාර්ය සාධන වර්තා සහ වෙනත් ලියකියවිලි වල ද්විතියික දත්ත මත ද විශ්වාසය තැබීය.

මෙම අධ්‍යයනය හුදෙක් 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත විසින් දක්වනු ලබන ක්‍රියාපටිපාටිය අධ්‍යයනය කිරීම, කොමිසමේ විමර්ශන, නිර්දේශ සහ ක්‍රියාවලියේ දුර්වලතා හඳුනා ගැනීමට මෙන්ම පුරවැසියන්ගේ දැනුවත්භාවය සම්බන්ධයෙන් සිදුකළ අධ්‍යයනයක් මිස තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ අයිතිය සහ එම පනතේ හරාත්මක නීති පිළිබඳ සිදු කළ අධ්‍යයනයක් නො වන බව සැලකිය යුතුය.

# 1. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ ගමන් මඟ

තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ කතා කිරීමේදී එහි ඉතිහාසය මීට වසර සිය ගණනක් පසු පසට ගමන් කරයි. ශ්‍රී ලංකාව තුළ පනතක් මගින් මෙය ස්ථාපිත කර ගතව ගොස් ඇත්තේ වසර 6 ක් පමණ කෙටි කාලයක් වුව ද එය මුලින්ම ආරම්භ කරනු ලැබුවේ 1766 වසරේ දී ස්වීඩනයේ ය. 1766 වර්ෂයේ නීතිගත කරන ලද එම පනත හඳුන්වා දෙනු ලැබුවේ "Freedom of Press Act" යනුවෙනි. වසර 250 කටත් වඩා ඉතිහාසයක් ඇති තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත මේ වන විට රටවල් සියයකටත් අධික සංඛ්‍යාවක ක්‍රියාත්මක වන අතර, 1966 දී අමෙරිකා එක්සත් ජනපදය, 1978 දී ප්‍රංශය, 1980 දී නෙදර්ලන්තය, 1982 දී එංගලන්තය, ඕස්ට්‍රේලියාව හා නවසීලන්තය, 1983 දී කැනඩාව, 1985 දී ඩෙන්මාර්කය, 2001 දී පාකිස්ථානය, 2005 දී ඉන්දියාව, 2007 දී නේපාලය, 2009 දී බංගලාදේශය, මාලදිවයින හා භූතානය වැනි රටවල ද ක්‍රියාත්මක වීම ආරම්භ විය. ඒ ආකාරයෙන් ශ්‍රී ලංකාවද තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත සම්මත කළ 113 වන රට ලෙස එම ලැයිස්තුවට එක්කාසු වන්නේ 2016 අග භාගයේදී ය.[1] මෙය ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදී භාවය පෙන්නුම් කිරීමේ එක් ප්‍රධාන සාධකයක් වන අතරම අසල්වාසීන් වූ ඉන්දියාවේ මෙම තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක වීම හරහා යම් අවධානයක් හා බලපෑමක් ශ්‍රී ලංකාවට සිදු වූ නමුත් තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳව පනත් කෙටුම්පත පවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවේ 2016 වර්ෂයේ දී ය.

තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පෙර පැවති නීතිමය තත්වය පිළිබඳ සලකා බලන විට තොරතුරු සැඟවීම අප රට තුළ තිබූ මූලික සංස්කෘතියක් ලෙස දැක්විය හැකිය. මෙම තත්වය සඳහා බලපෑ නීති වන්නේ රාජ්‍ය රහස් පනත, ආයතනික සංග්‍රහය, හදිසි නීති රෙගුලාසි, සහ පුවත් නීතියයි. එම නීති රෙගුලාසි හරහා ජනතාවට රාජ්‍ය තොරතුරු ලබාගැනීමේ අයිතිය සීමා වූ බව නොරහසකි. නමුත් පසුකාලීනව තොරතුරු දැන ගැනීමේ අයිතිය දිරි ගැන්වීමේ නීති කිහිපයක් දක්නට ලැබේ. ඒවා නම් 1975 වත්කම් හා වගකීම් ප්‍රකාශ කිරීමේ නීතිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන හා නඩු තීන්දු ආදිය යි. එම බොහෝ නඩු තීන්දු හරහා තොරතුරු දැන ගැනීමේ අයිතිය අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට ඇතුළත් බව ශ්‍රේෂ්ඨාධිකරණය ඇතැම් අවස්ථාවලදී ප්‍රකාශ කර ඇත.

පනත පිළිබඳ පළමු ලිඛිත ලේඛනය සොයා ගත හැකි වූයේ 1994 දී ය. සංචාරක තොරතුරු හා ගුවන් සේවා ඇමැති ධර්මසිරි සේනානායක මහතා 1994 දී 'රජයේ මාධ්‍ය ප්‍රතිපත්තිය' නමින් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළේ ය. එහි දෙවැනි වගන්තිය තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිගැනීම පිළිබඳව වූ අතර ඒ සඳහා ව්‍යවස්ථාපිත රැකවරණයක් ලබාදීමට පොරොන්දු වී තිබිණි. ඉන් පසුව, ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව 1996 දී තොරතුරු සඳහා ප්‍රවේශය පිළිබඳ පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළේ ය.[2]

එමෙන්ම තොරතුරු දැන ගැනීමේ අයිතිය මූලික අයිතිවාසිකම් යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පනත් කෙටුම්පතක් ලෙස 2002 වසරේ දී සකස් කර කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළ ද එය පාර්ලිමේන්තුව දක්වා පැමිණීමට ඉඩකඩ නො ලැබිණි. එම ප්‍රයත්නය ඒ මොහොතේ සාර්ථක වී නම් තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පනතක් ස්ථාපිත කළ පළමු දකුණු ආසියානු රට වන්නේ ශ්‍රී ලංකාවයි. ඉන් පසුවත් කිහිපවරක් විවිධ පාර්ශවයන් මේ අවශ්‍යතාව ඉස්මතු කළහ. ඒ අතර, කර්තෘ සංසදය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සහ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් තොරතුරු දැන ගැනීම පිළිබඳ පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමෙන් පසු 2004 දී කැබිනට් මණ්ඩලය පනතක් අනුමත කළේ ය. අධිකරණ අමාත්‍යාංශය සංශෝධන

[1] https://yukthiya.lk/9958-2/

[2] https://rti.gov.lk/rti-unit/

කිහිපයක් සහිතව අවසන් පනත් කෙටුම්පත ඉදිරිපත් කළමුත් පාර්ලිමේන්තුව විසුරුවා හැරීමත් සමග පනත් කෙටුම්පත පිළිබඳ ක්‍රියාවලිය අවසන් විය.

නැවතත් 2006 දී ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව විසින් දෙවන වරටත් තොරතුරු දැන ගැනීම පිළිබඳ පනතක් ඉදිරිපත් කරන ලදි. එහිදී ප්‍රජාතන්ත්‍රවාදය සඳහා මහජන සහභාගීත්වයක් ඇති කිරීම සඳහා තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත නීත්‍යානුකූලව සම්මත කළ යුතු බව ඔවුහු නිර්දේශ කළහ. එමෙන්ම සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ සම්මුතිය සහ දූෂණයට එරෙහි සම්මුතිය නම් වූ එක්සත් ජාතීන්ගේ සම්මුතීන් දෙකට ශ්‍රී ලංකාව අත්සන් කර ඇති බැවින් එවැනි ක්‍රියාවක අවශ්‍යතාව ඔවුහු සඳහන් කළහ.[3] කෙසේ නමුත් මෙම තොරතුරු දැන ගැනීමේ අයිතීන් සඳහා වූ සියලු ප්‍රයත්නයන් අසාර්ථක වූවත්, එම උත්සාහයන් හරහා අවසානයේ දී තොරතුරු දැන ගැනීමේ අයිතිය 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 2015 දී 19 වැනි සංශෝධනය මගින් හඳුන්වා දෙන ලදී. ඒ අනුව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (අ) ව්‍යවස්ථාව මගින් තොරතුරු කරා ප්‍රවේශවීමේ අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස සහතික කොට ඇත.

විවිධ සංශෝධන රාශියකින් පසුව 2016 ජූනි 24 දින තොරතුරු දැන ගැනීමේ අයිතිවසිකම පිළිබඳ පනත සම්මත වූ අතර, එය 2016 අගෝස්තු මස 05 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ දෙවනි කොටසේ අතිරේකයක් වශයෙන් 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ලෙස පළ කරන ලදි. මෙම පනත ලොව තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පනත්වලින් ඉහළම ශ්‍රේණියක් හිමි කර ගෙන ඇත.

20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය[4] මගින් එතෙක් පැවති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කොට ඒ වෙනුවට පාර්ලිමේන්තු සභාව පිහිටුවීම හේතුවෙන් තොරතුරු දැනගැනීම පිළිබඳ කොමිෂන් සභාවේ ස්වාධීනත්වයට බලපෑමක් ඇති වීමට ඉඩකඩ සැකසිණි. එතෙක් එවැනි පත්කිරීම් සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ අවශ්‍ය වුව ද, 20 වන සංශෝධනය හරහා පිහිට වූ පාර්ලිමේන්තු සභාවට හුදෙක් නිරීක්ෂණ ලබා දීමේ බලය පමණක් ලබාදී තිබුණි. මෙහිදී එම පත්කිරීම් සඳහා නිරීක්ෂණ ලබා ගත්ත ද එම නිරීක්ෂණ අනිවාර්ය ලෙසින්ම පත්කිරීම් සඳහා අදාල කරගැනීමට ජනපති බැඳී නොමැත. එහි දී කොමසාරිස්වරුන් පත්කිරීම සඳහා ජනාධිපතිට අභිමතානුසාරී බලයක් පවතින බව සහ ස්වාධීන හා සුදුසු කොමසාරිස්වරුන් පත්වේවි ද යන ප්‍රශ්නය මතු වී තිබුණද එකී තත්වය යම් පමණකට සමනය වූයේ වර්ෂ 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ ඇති සුවිශේෂත්වයක් හේතුවෙනි. එනම් එකී තොරතුරු දැන ගැනීමේ පනතේ 12 වන වගන්තිය තුළ කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස පත් කල යුතු වන්නේ එකී වගන්තිය තුළ දක්වා ඇති සංවිධාන හෝ සංවිධාන ප්‍රභේද විසින් නම් කරනු ලබන නියෝජිතයන් බව විශේෂයෙන් සඳහන් කර තිබීමයි. එම නිසා 20 වන සංශෝධනය යටතේ පත් කරන ලද වර්තමාන කොමිෂන් සභාවට ජනාධිපතිවරයාගේ තනි මතයට පත් වූයේ එක් සාමාජිකයකු පමණක් විය. සභාපතිවරයා පත් කිරීමේ බලය ජනාධිපතිවරයාගේ හස්තය යටතට පත් වීම තුළ කොමිෂන් සභාවේ ස්වාධීනත්වයට බලපෑමක් සිදු නොවුනා යැයි කිව නො හැකි අතර පොදුවේ සමස්ත ආයතන ව්‍යුහය 20 වන සංශෝධනය මගින් ජනාධිපතිවරයාගේ බලපෑමට ලක් වීම තොරතුරු දැන ගැනීමේ යාන්ත්‍රණයට ද බලපාන ලදී.

නැවතත් 21 වන ව්‍යවස්ථා සංශෝධනය[5] හරහා කතානායකවරයාගේ සභාපතීත්වයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් පිහිටුවීම සහ එමගින් ස්වාධීන කොමිෂන් සභා පත්කිරීම පිළිබඳ අවධානය යොමු කර ඇත. එහි දී මැතිවරණ කොමිෂන් සභාව හැර අන් සියලු කොමිෂන් සභා පාර්ලිමේන්තුවට වගකිව යුතු බවත්, පාර්ලිමේන්තුවට පිළිතුරු දීමට බැඳී සිටිය යුතු බවත් සඳහන් කර ඇත. එපමණක් නොව 19 වන ව්‍යවස්ථා සංශෝධනයේ පැවති ආකාරයෙන්ම ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට කරන ලද නිර්දේශයක් මත සහ සභාව විසින් අනුමත කර ඇත්නම් මිස, කොමිෂන් සභාවල කිසිම ධුරයකට ජනාධිපතිවරයා විසින් කිසිදු තැනැත්තකු පත් නො කළ යුතු බව ද දක්වා ඇත.

---

[3] https://rti.gov.lk/rti-unit/

[4] 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. https://www.parliament.lk/uploads/acts/gbills/sinhala/6176.pdf

[5] 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. https://www.parliament.lk/files/pdf/constitution-si.pdf

# 2. තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය

මානව හිමිකම් පිළිබඳ විශ්වීය ප්‍රකාශය මගින් ද අනෙකුත් අයිතීන් සේම තොරතුරු දැන ගැනීමේ අයිතිය විශ්ව මානව අයිතිවාසිකමක් ලෙස තහවුරු කර ඇති අතර එය සුරක්ෂිත කිරීමට සියලුම සාමාජික රටවල් ප්‍රගාමී ක්‍රියාමාර්ග ගත යුතු බව ප්‍රකාශ කර ඇත. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙහි 19 වැනි වගන්තියේ සඳහන් වන්නේ "සෑම තැනැත්තකුටම අදහස් දැරීමේ සහ ප්‍රකාශ කිරීමේ නිදහසේ අයිතිය ඇත; මෙම අයිතියට, බාධාවකින් තොරව අදහස් දැරීමට සහ සීමා නො තකා ඕනෑම මාධ්‍යයක් හරහා තොරතුරු සහ අදහස් වෙත ප්‍රවේශ වීමට, ලබා ගැනීමට සහ සන්නිවේදනය කිරීමට ඇති නිදහස ද ඇතුළත් වන"[6] බව ය. තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය යන්නෙන් අදහස් කරන්නේ, පොදු අධිකාරීන්ගෙන් තොරතුරු ඉල්ලා සිටීමට ඇති අයිතියයි. මෙහිදී පොදු අධිකාරීන් යනුවෙන් සඳහන් කරන්නේ ව්‍යවස්ථාපිත ආයතන, රාජ්‍ය දෙපාර්තමේන්තු සහ ආයතන, රජය විසින් පාලනය කරනු ලබන ආයතන, ප්‍රාදේශීය සහ පළාත්බද අධිකාරී මෙන්ම යුක්තිය පරිපාලන කිරීම සඳහා ස්ථාපිත කළ සියලු අධිකරණ සහ විනිශ්චය ආයතනයන් ය. එමෙන්ම ගිවිසුම් පදනම මත ක්‍රියාත්මක වන පෞද්ගලික ආයතන, ගිවිසුමක්, බලපත්‍රයක් හෝ හවුල් ව්‍යාපාරයක් ලෙස රජය සමඟ ක්‍රියාත්මක වන ආයතන, උසස් අධ්‍යාපන ආයතන, වෘත්තිය පුහුණු ආයතන හෝ කාර්මික විද්‍යාල, ඕනෑම ලිඛිත නීතිය යටතේ හඳුනාගනු ලැබූ හෝ බලපත්‍රලාභී හෝ පූර්ණ හෝ අර්ධ වශයෙන් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන සංවිධානයකින් ආධාර ලබා ගන්නා වූ පොදු සේවාවන් සපයන පෞද්ගලික ආයතන ද මේ ගණයට අයත් වේ.[7]

---

[6] එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (UDHR) 1948, 19 වැනි වගන්තිය. https://www.ohchr.org/en/udhr/documents/udhr_translations/eng.pdf

[7] http://www.rticommission.lk/web/index.php?option=com_content&view=article&id=8&Itemid=111&lang=si

# 3. 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත

2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත තොරතුරුවලට ප්‍රවේශ වීමට ඇති අයිතිවාසිකම පිළිබඳව අදාල විධිවිධාන සැලසීම සඳහා ද, තොරතුරු වෙත ප්‍රවේශ වීම ප්‍රතික්ෂේප කළ හැකි හේතු නිශ්චිතව දැක්වීම සඳහා ද, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව පිහිටුවීම, තොරතුරු නිලධාරීන් පත්කිරීම සහ තොරතුරු ලබාගැනීම සඳහා වන ක්‍රියාපටිපාටිය නිශ්චිතව දැක්වීම සහ ඊට සම්බන්ධ කාරණා, විධිවිධාන සැලසීම සඳහා ද ඉදිරිපත් කරන ලද පනතකි.

එම පනතේ පූර්විකාවේ සඳහන් කර ඇත්තේ මෙසේ ය.

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (අ) ව්‍යවස්ථාව මගින් තොරතුරු සඳහා ප්‍රවේශ වීමේ අයිතිය තහවුරු කර ඇති බැවින් සහ තොරතුරු ලබා ගැනීමේ අයිතිවාසිකම බලාත්මක කිරීම මගින් පොදු අධිකාරිවල විනිවිදභාවය සහ වගකීම පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීමේ අවශ්‍යතාවයක් පැන නැඟී ඇති බැවින් ද එමඟින් ශ්‍රී ලංකාවේ මහජනතාවට යහපාලනය සඳහා වැඩි වශයෙන් සහභාගි විය හැකි සමාජයක් ප්‍රවර්ධනය වන බැවින් ද තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත පනවනු ලැබේ"[8] .

මෙම පනතට අනුව, සෑම පොදු අධිකාරියක් සඳහාම තොරතුරු නිලධාරියෙක් සිටිය යුතු වේ. ඔහුගේ හෝ ඇයගේ කාර්යය වන්නේ තම පොදු අධිකාරිය වෙත ඉදිරිපත් කළ තොරතුරු ඉල්ලුම් පත්‍ර සඳහා තොරතුරු ලබා දීමට අදාල සියලු සහය ලබා දීමයි. එමෙන්ම නම් කළ නිලධාරියෙක් ද සිටිය යුතු අතර ඔහුගේ හෝ ඇයගේ කාර්යභාරය වන්නේ තොරතුරු නිලධාරියාගේ තීරණයෙන් අතෘප්තියට පත් තොරතුරු ඉල්ලුම්කරුවන් විසින් යොමුකරනු ලබන අභියාචනා සලකා බලා නියමිත කාලය ඇතුළත තොරතුරු ඉල්ලුම්කරු වෙත සිය තීරණය ලබා දීමයි.

නමුත් මෙම පනතේ 05 වන වගන්තියට අනුකූලව **විශේෂයෙන් සඳහන් කළ ඇති තොරතුරු පමණක් මහජනතාවගෙන් මුක්ත කොට ඇත.** එයට මහජන සුබසිද්ධිය හා සම්බන්ධයක් නැති පෞද්ගලික තොරතුරු, ජාතික ආරක්ෂාව සහ රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවලට හානිකර තොරතුරු, ශ්‍රී ලංකා ආර්ථිකයට හානිකර තොරතුරු, රහසිගත වාණිජමය තොරතුරු, පෞද්ගලික වෛද්‍ය වාර්තා, භාරකාරත්වය පදනම මත පවතින රහසිගත තොරතුරු, අපරාධ නඩු හෝ ජාතික ආරක්ෂාවට හානිවන තොරතුරු, තුන්වන පාර්ශවයන් පිළිබඳ තොරතුරු, අධිකරණයට අපහාස සිදු කළ හැකි තොරතුරු, අධිකරණයේ ස්වාධීනත්වයට හානිකර විය හැකි තොරතුරු, පාර්ලිමේන්තු වරප්‍රසාද හෝ පළාත් සභා වරප්‍රසාද හා ගැටෙන තොරතුරු, විභාගවල අඛණ්ඩත්වයට හානිකර තොරතුරු සහ මැතිවරණ සම්බන්ධයෙන් හා කැබිනට් සංදේශ සම්බන්ධයෙන් තීරණය කර නොමැති තොරතුරු යනාදිය මෙම ගණයට අයත් වේ.

එහෙත් පනතේ වගන්ති අංක 5(4) මගින් දක්වා ඇති පරිදි **එම තොරතුරු හෙළිදරව් කිරීමෙන් වන හානියට වඩා මහජන සුබසිද්ධිය වැඩි නම් එවැනි තොරතුරු ඉල්ලීමක් ප්‍රතික්ෂේප නො කළ යුතුයි.** මෙම ව්‍යාතිරේඛය 05 වන වගන්තියේ ඇති සියලුම මුක්තීන් ට අදාල වේ. මෙහි සඳහන් මහජන සුබසිද්ධිය යන්න අවසානාත්මක වශයෙන් කොමිසම විසින් අර්ථ නිරූපණය කරනු ඇත.[9] විශේෂයෙන් චාමර සම්පත් මහතා 2018 වසරේදී තොරතුරු ඉල්ලුම් පතක් මගින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ඉල්ලා සිටීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් තොරතුරු කොමිසමට යොමු කළ අභියාචනයේදී පාර්ලිමේන්තු වරප්‍රසාද

[8] 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත. http://www.rticommission.lk/web/images/pdf/act/rti-act-en-13122018.pdf

[9] ඉහත එම.

පදනම් කරගනිමින් තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කිරීම කල නො හැකි බවත් මහජන සුබසිද්ධිය වඩා වැදගත් නම් පාර්ලිමේන්තු වරප්‍රසාද හෝ 1975 අංක 1 දරන වත්කම් හා වගකීම් ප්‍රකාශ කිරීමේ නීතියේ ආවරණයන්ට යටත් නොවී එකී තොරතුරු ලබා දිය යුතු බවට තොරතුරු දැන ගැනීමේ කොමිෂන් සභාව ඔවුන්ගේ RTI 719/2018[10] අභියාචනා නියෝගයෙන් තීරණය කල අතර එකී තීරණයට එරෙහිව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ගොනු කල CA/RTI/0004/2021[11] දරන අභියාචනය ප්‍රතික්ෂේප කරමින් කොමිෂන් සභාවේ තීරණය අභියාචනාධිකරණය ද අනුමත කරන ලදී. එකී තීන්දුව මගින් පැහැදිලි වන්නේ මහජන සුබසිද්ධියට වැදගත් නම් තොරතුරු ලබා දීම සීමා කර ඇති තොරතුරු ද ලබා දිය හැකි බවයි.

[10] http://www.rticommission.lk/web/images/pdf/0719-2018/5.-RTIC-Appeal-Documentary-In-Person-Hearing-719-2018--.---.pdf

[11] https://www.rticommission.lk/web/images/pdf/Court_2023/Chamara_Samapath_Vs_SL_Parliament.pdf

# 4. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ යාන්ත්‍රණය නිසි ලෙස ක්‍රියාත්මක නොවුනහොත්, එසේත් නැතිනම් තොරතුරු දැන ගැනීමේ අයිතිය හා සම්බන්ධ රාජ්‍ය නිලධාරි යාන්ත්‍රණය දූෂිත වුවහොත් පාලකයින්ට හා රාජ්‍ය නිලධාරින්ට තම අකටයුතුකම් පිළිබඳ තොරතුරු පහසුවෙන්ම සඟවාලිය හැකිවේ. එය ඍජුවම මහජනතාවගේ යහපැවැත්මට හානිකර වේ. රාජ්‍ය නිලධාරින් ඉටුකරන කාර්යයන් පිළිබඳව පාරදෘශ්‍යභාවයක් නොමැති වීම නිසා ඒ පිළිබඳ ප්‍රශ්න කිරීමේ ඉඩකඩ ද සීමාවේ. එහිදී මෙම 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 11 වන වගන්තිය ප්‍රකාරව 2017 පෙබරවාරි 03 වන දා සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථාපනය කරනු ලැබූ ස්වාධීන කොමිෂන් සභාවක් වන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ මැදිහත් වීම හරහා යම් ආයතනයක් තොරතුරු ලබාදීමේ වගකීම පැහැර හැරියහොත්, ප්‍රතික්ෂේප කළහොත් හෝ ලබාදුන් තොරතුරුවලින් තොරතුරු ඉල්ලුම්කරු සෑහීමකට පත් නොවන්නේ නම් තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිසම හමුවේ අභියාචනා කිරීමේ අයිතිය පුරවැසියා සතුවේ. ඒ අනුව පුරවැසියාට නිසි ආකාරයෙන් තොරතුරු ලබාදීම සඳහා වැදගත් කාර්යභාරයක් තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව විසින් ඉටු කරනු ලබයි.

### දැක්ම

ශ්‍රී ලාංකීය පුරවැසියන් ඔවුන්ගේ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම ඵලදායී ලෙස ක්‍රියාත්මක කරගත හැකි බව සාක්ෂාත් කිරීම.

### මෙහෙවර

සියලු ශ්‍රී ලාංකීය පුරවැසියන්ගේ තොරතුරු දැන ගැනීමේ අයිතිය සංවර්ධනය කරමින් සහ සුරක්ෂණය කරමින්, ඵලදායී විනිශ්චය කිරීම් සහ සියලූ පොදු අධිකාරීන්ගේ භාවිතාවන් අධීක්ෂණය හරහා විනිවිදභාවයේ සහ යහපාලනයේ සංස්කෘතියක් අනුදකිමින් තමන්ට අදාළ සියලූ තොරතුරු පිළිබඳ පුරවැසියන් වඩාත් සාවධානී කිරීමට මගපෙන්වමින් ප්‍රගාමී ලෙස හෙළිදරව් කිරීම ප්‍රවර්ධනය කිරීම.

### අරමුණු

- වඩා ඵලදායි විනිශ්චයන් සැපයීම සහ ඒවා බලාත්මක කිරීම, පොදු අධිකාරීන් සහ තොරතුරු පතන්නන් අතර ඇතිවන ගැටුම් ඵලදායී ලෙස විනිශ්චය කිරීම.
- රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීම සඳහා සහාය දැක්වීම රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීමේදී සහයෝගයෙන් කටයුතු කිරීම, උනන්දුවක් දක්වන පාර්ශවයන්ගේ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ විශේෂිත පුහුණුව සඳහා සහාය දැක්වීම.
- මහජන දැනුවත්භාවය ඉහළ නැංවීම: කොමිෂන් සභා වෙබ් අඩවිය සහ මාධ්‍ය අන්තර්ක්‍රියා හරහා තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සම්බන්ධයෙන් මහජනතාවගේ අවබෝධය ඉහළ නැංවීම.
- වාර්තා කළමනාකරණය වැඩිදියුණු කිරීම: මාර්ගෝපදේශන ලබාදීම මඟින්, තොරතුරු කළමනාකරණය සම්බන්ධයෙන් නිශ්චිත උපදෙස් ලබා දීම.
- ප්‍රගාමී ලෙස හෙළිදරව් කිරීම ඉහළ නැංවීම - මාර්ගෝපදේශ නිකුත් කිරීම, අවම ප්‍රමිතීන් දැක්වීම, දැනට පවත්නා නීතිවල සංශෝධනවලට මුලපිරීම සහ කාලාන්තරික අගැයීම් සිදුකිරීම.
- ඵලදායී අධීක්ෂණ සහ ඇගයුම් පද්ධතියක් ස්ථාපිත කිරීම: උචිත ඔන්ලයින් විසඳුම් සහ අගැයීම් මෙවලම් උපයෝගීකර ගැනීම හරහා,

පොදු අධිකාරීන් විසින් තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාවට නංවන ආකාරය ඵලදායී ලෙස අධීක්ෂණය සහ ඇගයීම.

**(මූලාශ්‍රය - තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා වෙබ් පිටුවෙන්)**

තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ ස්වාධීන කොමිෂන් සභාවකි. එය ප්‍රධාන ලෙස මෙම අයිතිවාසිකම අධීක්ෂණය කරන හා බලාත්මක කරන ආයතනයයි. කොමිසම විසින් වඩා ඵලදායි විනිශ්චයන් සැපයීම සහ ඒවා බලාත්මක කිරීම, පොදු අධිකාරීන්ට එරෙහිව නඩු පැවරීම, රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීම සඳහා සහාය දැක්වීම, මහජන දැනුවත්භාවය ඉහළ නැංවීම, කොමිෂන් සභා වෙබ් අඩවිය සහ මාධ්‍ය අන්තර් ක්‍රියා හරහා තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සම්බන්ධයෙන් මහජනතාවගේ අවබෝධය ඉහළ නැංවීම, වාර්තා කළමනාකරණය වැඩිදියුණු කිරීම, ප්‍රගාමී ලෙස හෙළිදරව් කිරීම ඉහළ නැංවීම හා ඵලදායී අධීක්ෂණ සහ ඇගයුම් පද්ධතියක් ස්ථාපිත කිරීම වැනි කාර්යයන් ඉටුකරනු ලැබේ.

## 4.1 කොමිෂන් සභාවේ රාජකාරි, කාර්යයන් සහ බලතල

### 4.1.1 තොරතුරු කොමිෂන් සභාවේ කාර්යය සහ කර්තව්‍යයන් (14 වගන්තිය)

අ) 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ පොදු අධිකාරියට පවරා ඇති කාර්යයන් නිසි ලෙස ඉටු කරන්නේ ද සහ පනතට අනුකූලව කටයුතු කරන්නේ ද යන්න සහතික වීම.

ආ) පොදු අධිකාරියක් සම්බන්ධයෙන් සාමාන්‍ය සමාලෝචනය හා සුවිශේෂී සමාලෝචනය සඳහා නිර්දේශ සිදු කිරීම.

ඇ) මෙම පනත යටතේ යම් තොරතුරක් නිකුත් කිරීම සඳහා පොදු අධිකාරීන් විසින් අය කළ යුතු ගාස්තු තීරණය කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම.

ඈ) ගාස්තුවක් නො ගෙවා තොරතුරු නිලධාරියෙක් විසින් තොරතුරු ලබා දිය හැකි අවස්ථා නියම කිරීම.

ඉ) ක්‍රියාකාරී හෙළිදරව් කිරීමේ මූලධර්මය මත පදනම්ව ගාස්තු කාලසටහන් නියම කිරීම.

ඊ) පනතේ විධිවිධාන ඵලදායීව ක්‍රියාත්මක කිරීම පිළිබඳ රාජ්‍ය නිලධාරීන් සඳහා සහයෝගයෙන් පුහුණු කටයුතු කිරීම හෝ භාර ගැනීම.

උ) මෙම පනතේ අවශ්‍යතා සහ පනත යටතේ පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ප්‍රසිද්ධ කිරීම, සහ

ඌ) පොදු අධිකාරීන් සඳහා නිසි වාර්තා කළමනාකරණය සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම.

### 4.1.2 පනතේ දක්වා ඇති පරිදි කොමිෂන් සභාවේ බලතල

1. පරීක්ෂණ පැවැත්වීම හා එම පරීක්ෂණ සඳහා පෙනී සිටි ලෙස යම් තැනැත්තෙකු හට විධාන කිරීම.
2. යම් තැනැත්තෙකු විභාග කිරීම හා එම අය සන්තකයේ පවතින තොරතුරු සපයන ලෙස එම තැනැත්තාට නියම කිරීම.
3. පොදු අධිකාරිය භාරයේ පවත්නා තොරතුරු පරීක්ෂා කිරීම.
4. යම් නිශ්චිත ආකෘතියකින් තොරතුරු සපයන ලෙස පොදු අධිකාරියක් වෙත විධාන කිරීම.
5. යම් පොදු අධිකාරි විසින් රඳවාගෙන සිටිනු ලබන තොරතුරු ප්‍රසිද්ධ කරන ලෙස විධාන කිරීම.
6. 32 වන වගන්තිය යටතේ අතෘප්තියට පත් යම් තැනැත්තෙකු විසින් කොමිෂන් සභා වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා විභාග කිරීම හා තීරණය කිරීම.
7. නියමිත වෙලාවට තොරතුරු නොලැබීම හේතුවෙන් පුරවැසියකුගෙන් අය කරනු ලැබූ ගාස්තුව ප්‍රතිපූරණය කරන ලෙස විධාන කිරීම.
8. පනතේ 41 වන වගන්තිය යටතේ ජනමාධ්‍ය

විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලබන නියෝග සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

**(මූලාශ්‍රය - 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත)**

කොමිෂන් සභාව සෑම සතියකම සඳුදා සහ අඟහරුවාදා එහි පූර්ණ සැසි පවත්වයි. තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පනතේ 1 (3) වගන්තිය යටතේ 2017 ජනවාරි 20 දිනැති අංක (2002/42)[12] දරන අතිවිශේෂ ගැසට් පත්‍රයක් නිකුත් කිරීමත් සමඟ 2017 පෙබරවාරි 3 වන දින තොරතුරු දැන ගැනීමේ අයිතියට පුරවැසියන්ගේ ප්‍රවේශය ආරම්භ විය. තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පනතට අනුව, තොරතුරු සඳහා කරන ලද ඉල්ලීමකට තොරතුරු නිලධාරියා සහ නම් කරන ලද නිලධාරියා විසින් දෙන ලද ප්‍රතිචාරයෙන් පීඩාවට පත්වන ඕනෑම පුරවැසියෙකුට නියමිත කාලසීමාව ඉකුත්වීමෙන් පසු කොමිෂන් සභාවට අභියාචනා කළ හැකිය. තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පනතේ 15 වැනි වගන්තියට අනුව අභියාචනා විභාග සහ පරීක්ෂණ පැවැත්වීමේ බලය කොමිෂන් සභාව සතු වේ. දිවුරුම්/තහවුරු කිරීම යටතේ පුද්ගලයෙකු පරීක්ෂා කිරීමේ බලය මෙයට ඇතුළත් වන අතර පුද්ගලයාට ඔහු/ඇය සන්තකයේ ඇති ඕනෑම තොරතුරක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය වේ (නිදහස් කරන ලද තොරතුරු විශ්වාසයෙන් යුතුව පරීක්ෂා කරනු ලැබේ). පනතේ සපයා ඇති නිදහස් කිරීම්වලින් ආවරණය වේ යැයි සැලකෙන තොරතුරු ඇතුළු ව පොදු අධිකාරියක් සතු ඕනෑම තොරතුරක් පරීක්ෂා කිරීමට කොමිසමට බලය ඇත. කොමිෂන් සභාවට පොදු අධිකාරියකට යම් ආකාරයක තොරතුරු සැපයීමට සහ/හෝ පොදු අධිකාරියක් විසින් මහජනයාගෙන් වසන් කරන ලද තොරතුරු ප්‍රකාශයට පත් කිරීමට (නිදහස්වලට යටත් ඒවා හැර) යොමු කළ හැක. තොරතුරු සැපයීමේ ප්‍රමාදයක් ඇති විට පුරවැසියෙකුගෙන් අය කරන ගාස්තු ප්‍රතිපූරණය කරන ලෙස කොමිෂන් සභාවට පොදු අධිකාරියකට නියෝග කළ හැකිය.

මෙහි සංයුතිය පිළිබඳ සැලකීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශයන් මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සභාපතිවරයකු සහ සාමාජිකයන් 04 දෙනෙකු ඇතුලුව කොමසාරිස්වරුන් 05 දෙනෙකුගෙන් මෙම කොමිසම සමන්විත වේ. තොරතුරු දැන ගැනීමේ පනතෙහි විධිවිධාන අනුව, ශ්‍රී ලංකා නීතිඥ සංගමය, මාධ්‍ය සංවිධාන සහ වෙනත් සිවිල් සංවිධාන විසින් නම් කරනු ලැබූ තැනැත්තන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ජනාධිපතිවරයා වෙත නිර්දේශ කරනු ලැබිය යුතු විය. නිර්දේශිත තැනැත්තන් සමාජ ජීවිතයේ සුවිශේෂී තැනැත්තන් විය යුතු අතර ඔවුන් විසින් තෝරාගෙන ඇති ක්ෂේත්‍රයන්හි මනා අත්දැකීමෙන් හා විශිෂ්ටත්වයෙන් යුක්ත විය යුතුය. තවද ඔවුන් දේශපාලනමය හෝ යම් රාජ්‍ය හෝ අධිකරණ හෝ වෙනත් ලාභදායි ධූරයක් නො දරන තැනැත්තන් විය යුතු අතර, කිසිදු දේශපාලන පක්ෂයකට සම්බන්ධ නැති, කිසිදු ව්‍යාපාරයක් කරගෙන නො යන සහ යම් වෘත්තියක යෙදී නො සිටින අය විය යුතුය. කොමිෂන් සභා සාමාජිකයෝ හෙවත් කොමසාරිස්වරු වසර 5 ක් සඳහා සිය ධූරය හොබවති. කොමිෂන් සභාව විසින් එහි අධ්‍යක්ෂ ජනරාල්වරයා, සෙසු නිලධරයන් සහ සේවා නියුක්තිකයන් අවශ්‍යතාවය අනුව පත් කරනු ඇත.[13]

මෙම ක්‍රියා පටිපාටියට අනුකූලව 2016 පළමු කොමිසමේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබුවේ මහින්ද ගම්මන්පිල මහතා වන අතර, අනෙකුත් කොමසාරිස්වරුන් ලෙස විශ්‍රාමික විනිසුරු රෝහිණී වල්ගම මහත්මිය, ජ්‍යේෂ්ඨ නීතිඥ ක්‍රිෂාලි පින්ටෝ ජයවර්ධන මහත්මිය, නීතිඥ එස්. ජී පුංචිහේවා මහතා සහ ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන් මහතාය. 2021 වර්ෂයේ පත් කළ වර්තමාන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිසන් සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරන්නේ විශ්‍රාමික විනිසුරු උපාලි අබේරත්න මහතා වන අතර අනෙකුත් කොමසාරිස්වරුන් වශයෙන් කටයුතු කරන්නේ විශ්‍රාමික විනිසුරු රෝහිණී වල්ගම මහත්මිය, ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන මහත්මිය, ජ්‍යෙෂ්ඨ නීතිඥ ජගත් ලියනආරච්චි මහතා සහ මොහොමඩ් නහයියා මහතා යන අයයි.[14]


[12] 2017 පෙබරවාරි ජනවාරි 20 දිනැති අංක (2002/42) දරන ගැසට් (අතිවිශේෂ) නිවේදනය. http://documents.gov.lk/files/egz/2017/1/2002-42_S.pdf

[13] 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත. http://www.rticommission.lk/web/images/pdf/act/rti-act-si-13122018.pdf

[14] http://www.rticommission.lk/web/index.php?option=com_content&view=article&id=10&Itemid=141&lang=si

# 5. තොරතුරු දැන ගැනීමේ යාන්ත්‍රණය

## 5.1 තොරතුරු ඉල්ලුම් කිරීම




තොරතුරු ඉල්ලුම් සිදුකළ හැක්කේ ශ්‍රී ලාංකික පුරවැසියන්ට ය. මෙහි දී පුරවැසියා යන්නට, යම් ව්‍යවස්ථාපිත වූ හෝ ව්‍යවස්ථාපිත නො වූ මණ්ඩලයක සාමාජිකයන්ගෙන් හතරෙන් තුනකට නො අඩු සංඛ්‍යාවක් ශ්‍රී ලාංකීය පුරවැසියන් වන්නේ නම් එවැනි මණ්ඩලයක් ද ඇතුළත් වේ.

| තොරතුරු ඉල්ලුම් කළ හැකි ආකාර | ඉල්ලුම් කරන තොරතුරු ලබා ගත හැකි ආකාර |
|---|---|
| • 2017 පෙබරවාරි මස ගැසට් කරන ලද රීතී තුළ 01 වන ආකෘතිය ලෙස දක්වා ඇති අයදුම්පත භාවිතා කළ හැකි ය. කෙසේ නමුත් මෙම අයදුම්පත අනිවාර්ය නොවන අතරම ඉල්ලුම් කරන තොරතුරු සඳහන් ලිඛිත ඉල්ලීමක් ද ප්‍රමාණවත් වේ.<br><br>• එමෙන්ම පනතේ 24 (6) වගන්තිය සහ 2017 වර්ෂයේ ගැසට් කර ලද 4 වන රෙගුලාසියේ 4 වන අතුරු විධානය මඟින් තොරුතුරු ඉල්ලුම්කරුට තමාට අවශ්‍ය තොරතුරු විද්‍යුත් තැපැල (E-mail) හරහාද ලබාගැනීමට අවසර සපයා දී ඇත. | • සටහන්, ලේඛන,හෝ වාර්තා පරීක්ෂා කිරීම.<br>• සටහන් ලේඛන, සහතික පිටපත්, උද්ධෘත සහ වාර්තා ලබා ගැනීම.<br>• යම් ද්‍රව්‍යයක සහතික කරන ලද සාම්පලයක් ලබා ගැනීම.<br>• ඩිස්කටයක්, ක්ෂුද්‍ර සේයා පටයක්, ශබ්ද පටිගත කිරීමක්, වීඩියෝ පටයක් හෝ වෙන යම් ඉලෙක්ට්‍රොනික් ස්වරූපයකින් හා යන්ත්‍ර මගින් කියවිය හැකි වාර්තා හෝ පරිගණක වාර්තාවල මුද්‍රිත පිටපත් ලෙස ලබා ගත හැකිය.<br><br>• කෙසේ වුවද සටහන් ලබා ගැනීම, උද්ධෘත පිටපත් කිරීම, ජංගම දුරකථනයක් හෝ අතෙහි ගෙනයන කැමරාවක් මගින් ඡායාරූප ලබා ගැනීම, යන්නට අවසර හිමි වීමට අදාළ පොදු අධිකාරි අභිමතය මත තීරණය වන අතර අවස්ථානුකූල තොරතුරුවලට ප්‍රවේශ විය හැක්කේ සිදු කළ යුතු ගෙවීම් මුළුමනින්ම ගෙවා අවසන් කර පසුවයි. |

(මූලාශ්‍රය - තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා වෙබ් පිටුවෙන්)

| තොරතුරු නිලධාරියා | තොරතුරු නිලධාරියාගේ කාර්යයභාරය |
|---|---|
| • තොරතුරු නිලධාරියා (IO) යනු යම්කිසි පුද්ගලයෙකු තොරතුරු ඉල්ලීමක් සිදු කරන අවස්ථාවකදී අදාළ පොදු අධිකාරිය විසින් තොරතුරු ලබාදීමට අනුයුක්ත කර ඇති නිලධාරියා ය.<br><br>• මෙහි දී යම්කිසි පොදු අධිකාරියක තොරතුරු නිලධාරියෙකු පත් කොට නොමැති අවස්ථාවකදී පනතේ 23 වන වගන්තියට ප්‍රකාරව තොරතුරු නිලධාරියා බවට එම පොදු අධිකාරියේ ප්‍රධානියා හෝ ප්‍රධාන විධායක නිලධාරි ස්වයංක්‍රීයවම පත්වේ. | • එම නිලධාරියාගේ මූලික වගකීම වන්නේ තොරතුරු ඉල්ලා සිටින පුද්ගලයින්ට අදාල ඉල්ලීම පිළිගත් බවට කුවිතාන්සිය ලබාදීම.<br>• අදාළ ඉල්ලීම වාචිකව සිදුකොට ඇත්නම් එය ලේඛනගත කිරීම.<br>• අදාළ ඉල්ලීමට දින 14 ක් ඇතුළත තොරතුරු සපයන්නේ ද යන්න පිළිබඳවත්, ඒ සඳහා ගෙවිය යුතු මුදල යනාදිය පිළිබඳවත් දැනුවත් කිරීම. ඒ සඳහා වැඩි කාලයක් අවශ්‍ය වන්නේ නම් එය තොරතුරු ඉල්ලුම්කරුට දැනුම් දීම.<br>• එහිදී පුද්ගලයෙකුගේ ජීවිතය සහ නිදහස සම්බන්ධයෙන් වැදගත් වන තොරතුරු ඉල්ලා තිබේ නම් එය හදිසි ඉල්ලීමක් ලෙස සලකන අතර එවැනි ඉල්ලීම් කෙරෙහි පැය 48 ක් ඇතුළත ප්‍රතිචාර දැක්වීම.<br>• තොරතුරු ඉල්ලීම්වල ලිපිගොනුව පවත්වාගෙන යාම සහ තොරතුරු ඉල්ලීම්වලට නිසි ප්‍රතිචාර දැක්වීම සහ අවශ්‍ය වේ නම් අනෙකුත් නිලධාරීන්ගේ සහය පැතීම ද මීට ඇතුළත් වේ. |

(මූලාශ්‍රය - තොරතුරු දැන ගැනීමේ අයිතිවසිකම පිළිබඳ කොමිෂන් සභා වෙබ් පිටුවෙන්)

## 5.2 අභියාචනා පටිපාටිය

එම ක්‍රියාවලියෙන් අනතුරුව තොරතුරු නිලධාරියා තොරතුරු ලබා නොදීම හෝ ලබා දෙන ප්‍රතිචාරයට ඉල්ලුම්කරු සෑහීමකට පත් නො වන්නේ නම් එම ප්‍රතිචාරය ලැබීමෙන් දින 14 ක් ඇතුළත නම් කරන ලද නිලධාරියා වෙත අභියාචනා සිදු කළ හැකි ය. මෙහි දී නම් කරන ලද නිලධාරියා (DO) ලෙස හඳුන්වන්නේ පොදු අධිකාරියක පළමු අභියාචන අධිකාරී බලය දරන්නා වන අතර තොරතුරු නිලධාරියාගේ ප්‍රතිචාර නොදක්වන්නේ නම් හෝ, දැක්වූ ප්‍රතිචාරය පිළිබඳ තොරතුරු ඉල්ලුම්කරු සෑහීමකට පත් නොවන්නේ නම් ඔහුට හෝ ඇයට නම් කරන ලද නිලධාරියා වෙත අභියාචනා ඉදිරිපත් කළ හැකි ය.

යම් අවස්ථාවකදී පොදු අධිකාරිය විසින් නම් කරන ලද නිලධාරියෙකු පත් කොට නොමැති අවස්ථාවකදී එම අදාළ රාජ්‍ය ආයතනය හෝ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා එම ආයතනයේ නම් කරන ලද නිලධාරියා බවට ස්වයංක්‍රීයවම පත්වන අතර ඔහු හෝ ඇය වෙත සෘජුවම අභියාචනා ඉදිරිපත් කළ හැකි ය.[15]

---

[15] http://www.rticommission.lk/web/index.php?option=com_content&view=article&id=8&Itemid=111&lang=si

## 5.3 කොමිසමට අභියාචනා යොමු කිරීම

මෙම අභියාචනා ක්‍රියාපටිපාටියේදී පනත මගින් දැඩි අභියාචනා කාර්යපටිපාටියක් හඳුන්වා දී ඇති අතර, ඒ අනුව පොදු අධිකාරිය විසින් නම් කරන ලද නිලධාරියෙකු පත්කොට තිබෙන අවස්ථාවකදී පළමු අභියාචනය නම් කරන ලද නිලධාරියා වෙත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. ඉන් පසු එයට ලැබෙන ප්‍රතිචාරයට තොරතුරු ඉල්ලුම් කළ පුද්ගලයාට සෑහීමකට පත් විය නො හැකි නම් දෙවැනි අභියාචනය වශයෙන් තොරතුරු කොමිසම වෙත අභියාචන ඉදිරිපත් කළ හැකියි. මීට හේතුව වනුයේ අභියාචනයක දී නම් කරන ලද නිලධාරියාගේ තීන්දුවලට එරෙහිව කටයුතු කිරීමට කොමිසම වෙත නීතියෙන් බලය ලබා දී තිබීමයි.

තොරතුරු කොමිසම වෙත අභියාචනා ඉදිරිපත් කිරීමට හැකියාව ඇත්තේ නම් කරන ලද නිලධාරියා විසින් දක්වන හෝ නො දක්වන ලද ප්‍රතිචාර පිළිබඳ තොරතුරු ඉල්ලීම් කළ පුද්ගලයා සෑහීමකට පත් නොවන අවස්ථාවක දී සහ නම් කරන ලද නිලධාරීන්ගේ තීරණ ලබාගත නොහැකි අවස්ථා වලදී ය. එහි දී එම ප්‍රතිචාර ලැබීමෙන් හෝ නො ලැබීමෙන් මාස දෙකක් ඇතුළත කොමිසම වෙත අභියාචනා ඉදිරිපත් කිරීමට හැකියාව ඇත. කොමිසම වෙත විද්‍යුත් තැපැල හරහා අභියාචනය සිදු කළ නො හැකි අතර RTI රීති 13 (2) වන රීතියට අනුව කොමිසම වෙත අභියාචනාවක් යොමු කළ හැක්කේ ලියාපදිංචි තැපෑලෙන් හෝ පෞද්ගලිකව භාර දීමෙන් පමණි.[16]

අභියාචනා ලැබීමෙන් පසු පනතේ අරමුණු ඉටු කරගැනීමට අවශ්‍ය බව හැඟී යන්නේ නම් හා එහි අවශ්‍යතාවය පවතින විට කොමිසම විසින් අභියාචනා පිළිබඳ සලකා බලා පනතේ රීති අංක 20 අනුව දෙපාර්ශවය කැඳවා විභාගයට ගැනීමේ පටිපාටියට අනුකූලව විභාග කිරීම සහ තීරණ ගැනීම සිදු කරනු ලබයි. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පනත යටතේ කොමිසම විසින් නිර්දේශ කළ හැකි පියවර කිහිපයක් ඇත. එනම්, යම් තොරතුරු නිලධාරියෙකු සිතාමතා තොරතුරු ඉල්ලීම භාර ගැනීම ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට හේතු නො දක්වන්නේ නම් හෝ වැඩිපුර ගාස්තු අය කිරීමක් හෝ තොරතුරු ඉල්ලීම ක්‍රියාවලියේ යෙදීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඊට අදාළ පොදු අධිකාරියේ නිලධාරියාට එරෙහි ව විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාළ විනය පාලන අධිකාරිය වෙත නිර්දේශ කිරීමට කොමිසමට බලය ලබා දී ඇත.

එමෙන්ම යම්කිසි නම් කරන ලද නිලධාරියකු සිතාමතාම පනතේ 5 වන වගන්තිය ඇති හේතුවක් හැර වෙනත් හේතුවක් මත අභියාචනය ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ සාධාරණ හේතුවකින් තොරව අභියාචනය ලැබී සති තුනක් ඇතුළත ඒ පිළිබඳ තීරණයක් නොගන්නේ නම් එම නිලධාරීන්ට එරෙහිවද විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාල විනය පාලන අධිකාරිය වෙත නිර්දේශ ලබාදීමට කොමිසමට බලය ලබාදී ඇත.

මෙහි දී පනත යටතේ කොමිසම විසින් පරීක්ෂණ සිදු කර වැරදි සිදු කරනු ලැබූ පුද්ගලයන්ට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයක් හරහා නීතිමය පියවර ගැනීමට බලතල ලබා දී ඇත. එහිදී වැරදි ලෙස, අසම්පූර්ණ සහ දෝෂ සහිත තොරතුරු ලබාදීම, තොරතුරු විනාශ කිරීම, අවලංගු කිරීම, වෙනස් කිරීම, හෝ වසන් කිරීම, මෙන්ම කොමිසම ඉදිරියේ පෙනී සිටීමට අසමත්වීම, තොරතුරු ලබා නොදීම හෝ පරීක්ෂා කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ දිවුරුම් පිට අසත්‍ය තොරතුරු ලබා දීම සහ කොමිසම විසින් ලබා දෙන තීරණ බලාත්මක නො කිරීම සහ බාධා පැමිණවීම වැනි වැරදි මත නීතීමය පියවර ගැනීමට කටයුතු කළ හැකිය.

එහි දී මහේස්ත්‍රාත් අධිකරණයක නඩුවක් ගොනු කිරීමට කොමිසම වෙත බලය ලබා දී ඇති අතර එම වරද ඔප්පු වීමක දී අදාළ වරදකාරී පාර්ශ්වයන්ට රුපියල් පනස්දහසකට (50000.00) නො වැඩි දඩයකට හෝ වසර දෙකක් දක්වා සිරදඬුවමට හෝ එම ද්විත්වයටම යටත්වීමට සිදුවේ. එපමණක් නොව එම වරදකාරී පාර්ශවයන්ට එරෙහිව අදාල විනය පාලන අධිකාරිය විසින් විනය පියවර ද ගනු ලැබිය හැකි ය.[17] තොරතුරු කොමිසම වෙත අභියාචනා ඉදිරිපත් කර එමගින් ලැබෙන නිර්දේශ කෙරෙහි ද තොරතුරු ඉල්ලුම් කළ පුද්ගලයාට සෑහීමටකට පත්විය නො හැකිනම් එවැනි අවස්ථාවකදී එම තීරණ ලැබී මසක් ඇතුළත අභියාචනාධිකරණයේ ඒ සම්බන්ධව අභියාචනයක් ගොනු කිරීමට තොරතුරු ඉල්ලුම්කරුට හැකියාව පවතී.

[16] http://www.rticommission.lk/web/index.php?option=com_content&view=article&id=8&Itemid=111&lang=si

[17] http://www.rticommission.lk/web/index.php?option=com_content&view=article&id=8&Itemid=111&lang=si

# 6. තොරතුරු දැන ගැනීමේ අයිතියට රාජ්‍ය අධිකාරීන් බාධා කිරීම හා එකී බාධාවන් වැළැක්වීමට තොරතුරු දැන ගැනීමේ කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය

තොරතුරු පනතට අනුකූලව ඕනෑම පොදු අධිකාරියකින් පුරවැසියාට තොරතුරු ඉල්ලුම් කිරිමට හැකි වුවද තොරතුරු වසන් කිරීම සහ තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කිරීම සහ තොරතුරු අයිතිය සනාථ කිරිමට උත්සුක නොවීම බොහෝ නිලධාරීන්ගෙන් දක්නට ලැබෙන සෘණාත්මක පැතිකඩකි. සමහර අවස්ථාවල යම් පුද්ගලයෙක් ආන්දෝලනාත්මක කාරණයක් සම්බන්ධයෙන් තොරතුරු ඉල්ලුම් පතක් යොමු කළ විට ඒ තොරතුරු ඉල්ලුම් කළ පුද්ගලයා ඉලක්ක කර මෙම තොරතුරු කුමටදැයි දුරකතනයෙන් ප්‍රශ්න කළ අවස්ථා ද පසුගිය කාලවලදී දක්නට ලැබිණි. නමුත් තොරතුරු කොමිෂන් සභාව තහවුරු කර ඇති පරිදි තොරතුරු ඉල්ලීමකදී එය ඉල්ලා සිටින්නේ ඇයිදැයි පැහැදිලි කිරීමට තොරතුරු ඉල්ලන පුද්ගලයා බැඳී නැත. එසේ තිබියදීත් මේ අයුරින් කටයුතු කිරීම හරහා ඇති වන අර්බුදය වන්නේ සාමාන්‍ය වැසියන් බියට පත්වී තොරතුරු නොඉල්ලන තැනට තල්ලු වී යාමකි. වංචාවට දූෂණයට අත වනන නිලධාරීන් තොරතුරු ඉල්ලීම් ලැබීම ගැන වැඩි කැමැත්තක් දක්වන්නේ නැත. ඒ තොරතුරු පනතත් සමග ගෙවීම් වවුචරවල සිට සියලුම තොරතුරු ලබා ගැනීමට හැකියාව ඇති නිසාය.

එවැනි බොහෝ අවස්ථා සම්බන්ධයෙන් ඒ හා ගැටෙන බොහෝ පිරිස් තම අත්දැකීම් විවිධ ආකාරයෙන් ඉදිරිපත් කර ඇත. ඒ අතර, තොරතුරු දැන ගැනීමේ අයිතිය භාවිතා කරමින් තොරතුරු අයදුම්පත් 100 කට අධික සංඛ්‍යාවක් විවිධ පොදු අධිකාරී වෙත යොමු කරමින් තොරතුරු දැන ගැනීමේ යාන්ත්‍රණයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ අධ්‍යනය කළ මාධ්‍යවේදී තරිඳු ජයවර්ධන සහ මාධ්‍යවේදි බිඟුන් මේනක ගමගේ විසින් 2018 දී ලංකාදීප පුවත්පතෙහි තම අත්දැකීම් ලිපියක් මගින් පළ කර ඇත. එම ලිපියේ සඳහන් සිදුවීම් ආශ්‍රයෙන් තොරතුරු දැන ගැනීමේ යාන්ත්‍රණයේදි නිලධාරින්ගේ හැසිරීම සහ කොමිසමේ ක්‍රියාකාරිත්වය ගැන යම් අදහසක් ලබා ගත හැකිය.

**පුනරුත්ථාපනය වන හිටපු එල්.ටී.ටී.ඊ. සාමාජිකයන්ගේ සංඛ්‍යා ලේඛනයක් ඉල්ලූ පසු පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යංශයේ ප්‍රධානියාගෙන් ඇමතුමක්**

පුනරුත්ථාපනය කරන ලද හිටපු එල්.ටී.ටී.ඊ සාමාජිකයන් ගැනසංඛ්‍යාලේඛනයක්ඉල්ලාපුනරුත්ථාපනකොමසාරිස් ජනරාල් කාර්යංශයට තොරතුරු ඉල්ලීමක් යොමු කළ පසු එහි ප්‍රධානියා දුරකතන ඇමතුමක් ගෙන තොරතුරු ඉල්ලුම්කරුගෙන් තොරතුරු ඉල්ලා සිටීම ගැන ප්‍රශ්න කර ඇත. මෙය තොරතුරු ඉල්ලුම්කරුගේ අයිතිවාසිකමට සිදුකරන බලපෑමක් සහ තොරතුරු කොමිසම සනාථ කර ඇති පටිපටියට අනුකූලව නො වන කටයුත්තකි. ආරක්ෂාව හෝ ඊට අදාළ ආයතන සම්බන්ධයෙන් ඇති සියලුම තොරතුරු ජාතික ආරක්ෂාව හා සම්බන්ධ වී පවතින බැවින් ඒවා රහස් තොරතුරු බව බොහෝ දෙනාගේ අදහසයි. නමුත් එම තොරතුරුවලින් අති බහුතරයක් සත්‍ය ලෙසම රහස් තොරතුරු නොවේ. තොරතුරු දැන ගැනීමේ පනතත් සමග එම බහුතරයක් තොරතුරු හෙළි කළ යුතු වුවද නිලධාරීන්ගේ හණ මිටි අදහස් නිසා ඒවා හෙළි කරනවාට ඔවුන් අකමැතිය. පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යංශයේ වූයේ ද එයමය.

අවසානයේ අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට තොරතුරු ඉල්ලුම්කරුවන්ට තොරතුරු දැන ගැනීමේ කොමිසම දක්වා යෑමට සිදු විය. තොරතුරු කොමිෂන් සභාවේ පැමිණිලි විභාගය පැවැතියේ එහි සභාපති මහින්ද ගම්මන්පිල, එහි සාමාජිකයන් වන විනිසුරු රෝහිනී වල්ගම, නීතිඥ ක්‍රිෂාලි පින්ටො ජයවර්ධන, නීතිඥ එස් ජී පුංචි හේවා, ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන් සහ තොරතුරු කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් පියතිස්ස රණසිංහ යන මහත්ම මහත්මීන් ඉදිරියේ ය. පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යංශයේ ප්‍රධානියා නියෝජනය කරමින් එහි තොරතුරු නිලධාරියා පැමිණ සිටියේ ය.

තොරතුරු ලබා නො දීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවෙන් කළ කරුණු විමසීමේදී තොරතුරු නිලධාරියා ප්‍රකාශ කර සිටියේ ඉල්ලා සිටින තොරතුරු ජාතික ආරක්ෂාව හා සම්බන්ධ බැවින් ලබා දිය නො හැකි බවයි. මෙම තොරතුරු ඉල්ලීම ගැන අදාළ රේඛීය අමාත්‍යංශයෙන් හා ආරක්ෂක අමාත්‍යංශයෙන් උපදෙස් පතා ඇති බවත්, ඊට ප්‍රතිචාරයක් නො ලැබුණු බවත් තොරතුරු නිලධාරියා පැවසීය. තොරතුරු ඉල්ලුම්කරුවන් විසින් ඉල්ලා තිබුණේ පුනරුත්ථාපනය වූ හිටපු එල්.ටී.ටී.ඊ සාමාජිකයන් ගැන සංඛ්‍යා ලේඛන බැවින් එය ජාතික ආරක්ෂාවට බලපාන්නේ කෙසේදැයි පැහැදිලි කරන ලෙස කොමිසම තොරතුරු නිලධාරියාට දැනුම් දුන්නේ ය.

ඉන් පසුව තොරතුරු නිලධාරියා පවසා සිටියේ එම තොරතුරු හෙළිදරව් කිරීමෙන් පුනරුත්ථාපනය වූ එල්.ටී.ටී.ඊ සාමාජිකයන්ගේ පෞද්ගලිකත්වයට හානි වන බැවින් ඒවා හෙළිදරව් කරනවාට තමා එකඟ නො වන බවයි. සංඛ්‍යාලේඛන කිහිපයක් හෙළිදරව් කිරීමෙන් ඔවුන්ගේ පෞද්ගලිකත්වයට හානිකර වන්නේ කෙසේදැයි කරුණු දැක්වීමට තොරතුරු නිලධාරියාට නොහැකි විය.

ඒ අනුව තම නියෝගය ලබා දෙමින් තොරතුරු කොමිෂන් සභාව සඳහන් කළේ තොරතුරු ඉල්ලා සිටීමට හේතුව විමසීමෙන් පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යංශය තොරතුරු පනතේ 24 වැනි වගන්තියේ පස් වැනි උප වගන්තියේ (ඇ) යන වගන්තිය උල්ලංඝණය කර ඇති බවයි. එම වගන්තිය මෙසේ ය.

"ඔහු හෝ ඇය සම්බන්ධ කරගත හැකි අවශ්‍ය විස්තර හැර තොරතුරු ඉල්ලා සිටීමට හේතු කිසිවක් හෝ වෙනත් පෞද්ගලික විස්තර ලබා දීම අවශ්‍ය නොවන්නේය."[18]

දින දෙකක විභාගයකින් පසු තොරතුරු කොමිසම පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයට නියම කළේ ඉල්ලා සිටින සියලු තොරතුරු කොමිසම හරහා ලබා දෙන ලෙසයි.[19] මෙම සිදුවීම මෙන්ම තවත් බොහෝ සිදුවීම් අපට පසුගිය කාලවකවානුව තුළ දක්නට ලැබිණි.

## තොරතුරු දැන ගැනීමේ කොමිෂන් සභාව විසින් පොදු අධිකාරියකට එරෙහිව මහෙස්ත්‍රාත් අධිකරණයක් හමුවේ පැවරූ ප්‍රථම නඩුව

2019 පෙබරවාරි 19 වැනිදා සෞඛ්‍ය අමාත්‍යාංශයේ පැවැති මාධ්‍ය සාකච්ඡාවකදී ආනයනික කිරිපිටිවල මේදය හැර වෙනත් කිසිවක් අඩංගු නොවන බවට දේශීය පරීක්ෂණවලදී හෙළි වී ඇතැයි සෞඛ්‍ය බලධාරීන් සිදුකල ප්‍රකාශය සම්බන්ධව සමාජ කතාබහක් ගොඩනැගිණි. ඉන් පසු නිදහස් සෞඛ්‍ය සේවය සඳහා වූ ජනතා ව්‍යාපාරය නියෝජනය කරමින් වෛද්‍ය නිලාන් ප්‍රනාන්දු මහතා ආනයනික කිරිපිටිවල අඩංගු ද්‍රව්‍ය සම්බන්ධයෙන් තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ 2019.02.27 වන දින සෞඛ්‍ය අමාත්‍යංශයට තොරතුරු ඉල්ලුම් පතක් යොමුකරන ලදි. එහිදී වෛද්‍යවරයා අමාත්‍යාංශයේ ඉල්ලා සිටියේ එම මාධ්‍ය සාකච්ඡාවේදී පැවසූ අනායනික කිරිපිටි සම්බන්ධව දේශීය පරීක්ෂණ සිදු කළේ කුමන පරීක්ෂණාගාරයේ ද? කවදා ද? කවුරුන් විසින් ද? සහ එම පරීක්ෂණ වාර්තාවේ සම්පූර්ණ පිටපතක් ලබා දෙන ලෙසත්ය. නමුත් එම ඉල්ලීමට තොරතුරු නිලධාරීයා විසින් ප්‍රතිචාර ලෙස දක්වා තිබුණේ ඉහත තොරතුරු ලබා දිය නොහැකි බවයි. ඉන් පසුව තොරතුරු ඉල්ලුම්කරු විසින් නම් කරන ලද නිලධාරියා වෙත තම අභියාචනය ඉදිරිපත් කළ ද, එයට ද සාධනීය පිළිතුරක් නො ලැබිණි. එහිදී ඔවුන් දන්වා එවා තිබුණේ එම තොරතුරු තෙවන පාර්ශවයකට අයත් තොරතුරු බවත් එම නිසා තොරතුරු දැන ගැනීමේ පනතේ 29 (2) (ඇ) වගන්තිය යටතේ තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කරන බවත් ය. එම පිළිතුරෙන් සෑහීමකට පත් නොවූ නිලාන් ප්‍රනාන්දු මහතා 2019.07.19 වන දින තොරතුරු කොමිසම වෙත අභියාචනයක් යොමු කරන ලදි.[20]

[18] 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත. http://www.rticommission.lk/web/images/pdf/act/rti-act-si-13122018.pdf

[19] https://www.lankadeepa.lk/features/%E0%B6%AD%-E0%B6%BB%E0%B6%AD%E0%B6%BB-%E0%B6%AF%E0%B6%B1-%E0%B6%9C%E0%B6%B1%E0%B6%B8-%E0%B6%B4%E0%B6%B1%E0%B6%AD-%E0%B7%84-

[20] 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත. http://www.rticommission.lk/web/images/pdf/act/rti-act-si-13122018.pdf

ඉන් පසුව තොරතුරු කොමිසම විසින් දීර්ඝ විභාගයකින් අනතුරුව RTI 1720/2019[21] අභියාචනා නියෝගය මගින් 2021.10.21 වන දින තීරණය කරන ලද්දේ වහාම තම කොමිෂන් සභාවට හා ඉල්ලුම්කරුට එකී වාර්තාවේ පිටපත් මුදාහරින ලෙසට ය. නමුත් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කොමිසම විසින් ලබා දුන් එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම මග හැර ඇත. එලෙස තොරතුරු දැන ගැනීමේ කොමිෂන් සභාව විසින් තොරතුරු පනත යටතේ ලබා දුන් නියෝගය හා නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් කොමිෂන් සභාව විසින් කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ MC No 85399/01 නඩුවක් පවරන ලදි.

එය තොරතුරු දැන ගැනීමේ කොමිෂන් සභාව විසින් පොදු අධිකාරියකට එරෙහිව මහෙස්ත්‍රාත් අධිකරණයක් හමුවේ පැවරූ ප්‍රථම නඩුව ලෙස සැලකේ. මෙම නඩුව කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ කැඳවූ අවස්ථාවේදී තොරතුරු දැන ගැනීමේ අයිතියේ 32(1), 32(3), 39(1) වගන්ති උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් විත්තිකරුවන් දෙදෙනෙකුට සිතාසි නිකුත් කරන ලෙස තොරතුරු දැන ගැනීමේ අයිතිය කොමිසම වෙනුවෙන් පෙනී සිටි නීතිඥ හිමාලි කුලරත්න මහත්මිය ඉල්ලීමක් කළාය. ඒ අනුව 2023 මාර්තු 21 වැනිදා තම අධිකරණය හමුවේ පෙනී සිටින ලෙස දන්වා සෞඛ්‍ය අමාත්‍යාංශය නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය ජේ.සී. ගම්ලත් මහතාට සහ එම අමාත්‍යාංශයේ තොරතුරු නිලධාරී වී.ටී.එස්. සිරිවර්ධන මහතාට සිතාසි යැවීමට කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් ප්‍රසන්න අල්විස් මහතා නියෝග කළේ ය. එසේම මෙම නඩුවේ විමර්ශන කටයුතු තව දුරටත් සිදු වෙමින් පවතී.[22]

මෙම සිදුවීම්වලින් පැහැදිලි වන කරුණු කිහිපයක් ඇත. එනම්,

- තොරතුරු කොමිසමට තමා සතුව ඇති බලය හරහා පුරවැසියාගේ තොරතුරු දැන ගැනීමේ අයිතිය කෙතරම් දුරට සුරක්ෂිත කළ හැක්කේ ද යන්න.
- රාජ්‍ය නිලධාරීන් ජනතාවට ලබාදී ඇති මෙම අයිතිය සහතික කිරීමේදී ක්‍රියාත්මක වන මන්දගාමී හා වගකීම් විරහිත ස්වරූපය.
- පුරවැසියාට මෙම පනත හරහා ලැබී ඇති මෙම අයිතිය මගින් තොරතුරු ඉල්ලුම් කළ හැකි පොදු අධිකාරීන් හා එම යාන්ත්‍රණය පිළිබඳව බහුතරයකට නිසි අවබෝධයක් නො මැති වීම යන්නයි.

වෙනත් ලියුමක් මෙන් මෙම තොරතුරු ඉල්ලුම්පත අත්හැර දැමිය හැකි දෙයක් නො වන අතර එය පුරවැසි අයිතින් තහවුරු කර ගැනීමට යොදා ගත හැකි හොඳම මහජන අවියකි. එයට හොඳම උදාහරණය වන්නේ ඉන්දියාවයි. අද වනවිට ඉන්දියාවේ RTI යන වචනය ක්‍රියාපදයක් ලෙසත් භාවිතා කරනවා පමණක් නොව එමගින් ඉන්දියානු පුරවැසියෝ උපරිම ඵල නෙළා ගනිමින් සිටිති. ඉහත කී CA/RTI/0004/2021[23] අභියාචනාධිකරණ තීරණයේදී ද තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ ඉන්දියානු නඩු නීතිය කෙරෙහි ගරු අභියාචනාධිකරණයේ අවධානය යොමු වී ඇත.

M.R. Misra Vs. The Supreme Court of India (CIC/SM/A/2011/000237/Secretary General) නඩු තීන්දුවේ දී ඉන්දියානු නීතිය තුළ තොරතුරු ලබා දීම පිළිබඳ අනෙක් නීතීන් සහ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත අතර නොගැළපීමක් ඇති වුව හොත් එකී සියළු නීති අභිබවා තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිම් පිළිබඳ පනත බලාත්මක වන බව පෙන්වා දී ඇත.

**“Where there is any inconsistency in a law as regards furnishing of information, such law shall be superseded by the RTI Act. Insertion of a nonobstante clause in section 22 of the RTI Act was a conscious choice of Parliament to safeguard the citizen’s fundamental right to information… If the PIO has received a request for information under RTI Act, the information**

[21] ඉහත එම.

[22] https://divaina.lk/%E0%B6%9A%E0%B7%92%E0%B6%BB%E0%B7%92%E0%B6%B4%E0%B7%92%E0%B6%A7%E0%B7%92-%E0%B6%AD%E0%B7%9C%E0%B6%BB%E0%B6%AD%E0%B7%94%E0%B6%BB%E0%B7%94-%E0%B6%B1%E0%B7%9C%E0%B6%AF%E0%B7%94%E0%B6%B1%E0%B7%8A/

[23] https://www.rticommission.lk/web/images/pdf/Court_2023/Chamara_Samapath_Vs_SL_Parliament.pdf

**shall be provided to the applicant as per the provisions of the RTI Act and any denial of the same must be in accordance with section 8 and 9 of the RTI Act only."**

ඉන්දියාව තුළ මෙම තොරතුරු පනත ඉතා ප්‍රායෝගිකව හා ඵලදායි ලෙස භාවිතා වන අන්දම පෙනී ගියද තවමත් ශ්‍රී ලාංකීය පුරවැසියන්ට මෙම පනත පිළිබඳ එතරම් දැනුවත්භාවයක් නොමැත. නමුත් මෙම යාන්ත්‍රණය පිළිබඳ දැනුමෙන් සන්නද්ධ පුද්ගලයන් එහි ඵල නෙළා ගන්නා අතර බොහෝ පිරිස් එය හුදෙක් තවත් එක් වචනක් ලෙස පමණක් සලකා පනතෙන් ප්‍රයෝජන නො ගනිති. එම නිසා මෙම පනත ජනතාව අතර ප්‍රචලිත කිරීම කාලීන අවශ්‍යතාවක් බව මනාව පැහැදිලි වේ.

# 7. තොරතුරු කොමිසම විසින් ලබා දෙන නිර්දේශයන් ක්‍රියාත්මක වීම

තොරතුරු පනත යනු රටේ පුරවැසියන් වෙත ලැබුණු ඉතා වටිනා වරප්‍රසාදයකි. මන්ද අනෙක් බොහෝ නීති රෙගුලාසින් සැකසී ඇත්තේ රාජ්‍ය පාලකයන්ගේ අභිමතය සහ අවශ්‍යතාව මූලික කොට ගෙනයි. අද වන විට පුරවැසියන් තොරතුරු වෙත ලඟා වීමට උනන්දුවක් දැක් වුවත් ඇතැම් පොදු අධිකාරීන් තොරතුරු ලබා දීමට කටයුතු නො කරන්නේ ඔවුන්ගේ අධිකාරී බලය දිගින් දිගටම තොරතුරු දැන ගැනීමේ අයිතියට ඉහළින් පවත්වා ගැනීමටයි. ඒ ආකාරයෙන් තොරතුරු ලබා දීම මග හරිනවා නම් පුරවැසියාගේ තොරතුරු දැන ගැනීමේ අයිතිය සුරක්ෂිත කිරීමේ ආරක්ෂයා වන්නේ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවයි. එම නිසා තොරතුරු ලබා නො දීම, හෝ ප්‍රමාණවත් තොරතුරු ලබා නොදීම නිසා බොහෝ පිරිස් තොරතුරු කොමිසම වෙත තම අභියාචනා විශාල වශයෙන් යොමු කරන්නේ එමඟින් තොරතුරු ලබා ගැනීම සඳහා පනතේ නිත්‍යානුකූල බලය මගින් උපකාර ලබා ගැනීමටයි. 2017 පෙබරවාරි 03 වන දා සිට මේ දක්වාම තොරතුරු කොමිසම වෙත බොහෝ අභියාචනා ඉදිරිපත් වී ඇති අතර ඒ අතරින් කොමිසමේ නිර්දේශ මත බොහෝ පොදු අධිකාරීන් විසින් තොරතුරු ලබා දීම සිදු කර ඇත. එපමණක් නොව ඒ හරහා සැඟ වී තිබූ බොහෝ වංචා දූෂණ එළි වූ අතර සිදුවීමට ඉඩ තිබූ වංචාවන් වැළකී ගියේ ය. එහෙත් යම් යම් අවස්ථාවන්වල තොරතුරු කොමිසම විසින් ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක නොවූ අවස්ථාවන් මෙන්ම එම තීරණ අභියෝගයට ලක් කළ අවස්ථාවන් ද පසු ගිය කාල වකවානුවේ දක්නට ලැබිණි.

එහි දී තොරතුරු කොමිසමේ තීරණ අභියෝගයට ලක් වූ ප්‍රධානතම සිදුවීම් කිහිපයක් දැකගත හැකිය. ඉන් ප්‍රධානතම සිදු වීම් දෙකක් මෙම අධ්‍යයනය තුළ විමසීමට ලක් කරන ලදී.

### ❖ පාර්ලිමේන්තු මන්ත්‍රීන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ඉල්ලා සිටීම

තොරතුරු පනත බලාත්මක වූ මුල් වකවානුවේ සිටම එම ක්‍රියාවලිය සමඟ කටයුතු කළ නිදහස් මාධ්‍යවේදී චාමර සම්පත් මහතා මෙම අධ්‍යයනය සඳහා සිදු කළ අදහස් විමසීමේදී දැක් වූ අදහස මෙසේ ය. ඔහු විසින් 2018 වසරේ දී අද පුවත්පතේ මාධ්‍යවේදියෙකු ලෙස තොරතුරු ඉල්ලුම් පතක් මඟින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ඉල්ලා සිටීමේ සිදුවීම මෙහිදී පාදක කොට ගෙන ඇත.

මෙම තොරතුරු ඉල්ලුම් පත්‍රය පාර්ලිමේන්තු තොරතුරු නිලධාරියා වෙත යොමු කරන්නේ 2018.06.21 වන දින, 2010 වර්ෂයේ සිට 2018 දක්වා පාර්ලිමේන්තු මන්තීවරුන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දී තිබේද නැද්ද යන්න පිළිබඳ තොරතුරු ලබා ගැනීමටයි. මහජන ඡන්දයෙන් පත්වන මහජන නියෝජිතයන් තම වත්කම් බැරකම් ප්‍රකාශ පාර්ලිමේන්තුවට ලබා දිය යුතු අතර එය දැන ගැනීම මහජන අයිතියකි. නමුත් චාමර මහතාගේ තොරතුරු ඉල්ලුම් පතට තොරතුරු නිලධාරියා ප්‍රතිචාර ලෙස දක්වා තිබුණේ තොරතුරු ලබා දීම සිදු කළ නොහැකි බවයි. එයට හේතුව ලෙස සඳහන් කර තිබුණේ ඔවුන් සන්තකයේ ඉල්ලුම් කර ඇති තොරතුරු නොමැති බවය. නමුත් මන්ත්‍රීවරුන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශන පාර්ලිමේන්තුව සතුව තිබිය යුතු බැවින් චාමර සම්පත් මහතා නැවතත් නම් කරන ලද නිලධාරියා වෙත තම අභියාචනය 2018.08.30 වන දින යොමු කර ඇත. නම් කළ නිලධාරියාද අභියාචනයට ප්‍රතිචාර ලෙස ලබා දී ඇත්තේ වත්කම් බැරකම් ප්‍රකාශ පාර්ලිමේන්තුවට ලබා දුන්නත් එම තොරතුරු පාර්ලිමේන්තු මහලේකම් භාරයේ නොමැති වීම නිසා තොරතුරු ලබා දිය නොහැකි බවයි. එම පිළිතුරෙන් සෑහීමකට පත් නොවූ චාමර සම්පත් මහතා තොරතුරු කොමිසම වෙත තම අභියාචනය 2018.09.11 වන දින යොමු කළේ තමා ඉල්ලුම් කළ තොරතුරු නිවැරදිව ලබා ගැනීමේ අරමුණෙනි.

ඉන් පසුව කොමිෂන් සභාව මෙම අභියාචන විභාගට ගැනීම ආරම්භ කර ඇති අතර වසර දෙකකට අධික කාලයක් විමර්ශන කටයුතු සිදු කර ඇත. එම කාලවකවානුව තුළ දී විවිධ තර්ක විතර්ක ගෙන එමින් තොරතුරු ලබා නො දීමට පාර්ලිමේන්තු නිලධාරීන් කටයුතු කළ අතර එහි දී තොරතුරු ලබා දීම කළ හැක්කේ කතානායකවරයාට බවත් මහලේකම් හට ඒ සම්බන්ධව තීරණය ගැනීමට නොහැකි බවත් කොමිසමට දන්වා තිබිණි. එපමණක් නොව තොරතුරු ලබා දීමට නීතිපතිවරයාගේ උපදෙස් ලබා යුතු බව ද දන්වා තිබූ අතර පසුව නීතිපතිවරයා ලබා දුන් උපදෙස් අනුව ද තොරතුරු ලබා දිය නො හැකි බව තොරතුරු කොමිසම වෙත දන්වා ඇත.

වසර දෙකක කාලයක් විභාග කිරීමෙන් අනතුරුව මෙම තොරතුරු ඉල්ලුම්කරු ඉල්ලා ඇත්තේ වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දුන් මන්ත්‍රීවරුන්ගේ නම් ලයිස්තුවක් බැවින් එය වත්කම් බැරකම් පනත යටතේ නොව තොරතුරු දැන ගැනීම පනත යටතේ සිදුකළ ඉල්ලීමක් බව කොමිසම විසින් RTI 719/2018[24] අභියාචනා නියෝගය මගින් 2021.02.11 දින තීරණය කරන ලදි. ඒ අනුව එහිදී කිසිදු මන්ත්‍රීවරයෙකුගේ අයිතිවාසිකමක් කඩ නොවන බැවින් තොරතුරු මුදා හරින ලෙස කොමිසම පාර්ලිමේන්තු වෙත දන්නා ඇත. එහිදී තොරතුරු කොමිසම තොරතුරු ලබා දීමට පිටු 16 කින් සමන්විත තීන්දුවක් පාර්ලිමේන්තුව වෙත යොමු කළ ද පාර්ලිමේන්තු විසින් එම තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කර ඇත. තොරතුරු ලබා දීම වෙනුවට පාර්ලිමේන්තු මහ ලේකම් සිදුකර ඇත්තේ කරුණු 15 යටතේ හේතු දක්වමින් තොරතුරු කොමිසම විසින් ලබා දුන් තීරණය බල රහිත කරන මෙන් අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමයි. ඉන් පසුව අභියාචනාධිකරණයේදී මේ සම්බන්ධව දීර්ඝ කරුණු විමසීමකින් අනතුරුව 2023.02.28 දින තීරණය කරනු ලැබුවේ තොරතුරු ඉල්ලුම්කරුට තොරතුරු ලබා දීමට හැකි බවයි. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ තීරණයන්ට එදිරිව අභියාචනාධිකරණයේ නඩු කිහිපයක් පැවතුනද තීරණයක් ලබා දුන් පළමු අභියාචනය මෙය වන අතර එය තොරතුරු පනත ශක්තිමත් වන ආකාරයේ නඩු තීන්දුවක් විය. එහිදී මන්ත්‍රීවරුන් මහජනතාව විසින් නඩත්තු කරන අතර ඔවුන් සිය වත්කම් හා බැරකම් ප්‍රකාශයට පත් කිරීමට නීතියෙන් බැඳී සිටින බවත්, තොරතුරු දැන ගැනීමේ පනතේ ප්‍රතිපාදන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ද අදාළ වන බවත් තොරතුරු කොමිසමේ තීරණ ක්‍රියාත්මක කිරීමට මන්ත්‍රීවරුන්ද නීතියෙන් බැඳී සිටින බවත් අභියාචනාධිකරණය විසින් තීන්දු කරන ලදි. ඒ අනුව වත්කම් හා බැරකම් ප්‍රකාශ මුදාහරින ලෙස තොරතුරු කොමිසම විසින් 2021 වසරේ පෙබරවාරි මස 02 වන දා දුන් නියෝගය තහවුරු කරමින් පාර්ලිමේන්තු මහලේකම්වරයාගේ අභියාචනය ප්‍රතික්ෂේප කරන බවත් තීන්දුවේ සඳහන් කොට ඇත.[25]

චාමර සම්පත් මහතා 2010 වසරේ සිට 2018 වසර දක්වා තොරතුරු ඉල්ලුම් කරත්, අභියාචනාධිකරණයේ තීන්දුවට අනුව 2023 වසර දක්වාම තොරතුරු පාර්ලිමේන්තුව විසින් නිකුත් කිරීම සිදුව ඇත. නමුත් චාමර සම්පත් මහතා සඳහන් කර සිටියේ අභියාචනාධිකරණය තීන්දුව ලබා දී තිබියදීත් මේ වනතුරු තමාට ඉල්ලුම් කළ තොරතුරු කිසිවක් ලැබී නොමැති බවයි.

එම සිදුවීම මගින් පෙනී යන්නේ තවමත් රාජ්‍ය යාන්ත්‍රණය මෙම තොරතුරු පනතට අනුගතව වීමට කිසිදු උත්සාහයක් නො ගන්නා බවයි. එසේම නිලධාරීන් තවමත් කොමිසමේ තීරණයන්ට වඩා තම අධිකාරී බලය රැක ගැනීමට පමණක් කටයුතු කරන ආකාරයයි. තොරතුරු කොමිසම කෙතරම් නිවැරදි තීරණ ලබා දුන්නත් එය ක්‍රියාත්මක වීමේ ඇති ගැටලුකාරී ස්වභාවය මෙයින් මනාව පැහැදිලි වේ. එපමණක් නොව පුද්ගලයෙකු තොරතුරු ඉල්ලුම් කිරීමක් සිදු කරන්නේ හැකි ඉක්මනින් එම තොරතුරු තමා වෙත ලඟා කර ගැනීමේ අරමුණෙනි. නමුත් මෙම සිදුවීමට අනුව තොරතුරු ඉල්ලුම්කරු වසර 5 ක් බලා සිටිය ද තමා වෙත තොරතුරු ලබා ගැනීම නො හැකිවීම මෙහි දක්නට ඇති ප්‍රධානතම ගැටලුව වේ.

[24] http://www.rticommission.lk/web/images/pdf/0719-2018/5.-RTIC-Appeal-Documentary-In-Person-Hearing-719-2018--.---.pdf

[25] https://www.rticommission.lk/web/images/pdf/Court_2023/Chamara_Samapath_Vs_SL_Parliament.pdf

## ❖ පොදු අධිකාරියත් තොරතුරු කොමිසමත් වගඋත්තරකරුවන් කර අභියාචනාධිකරණයේ පැවරූ තොරතුරු ඉල්ලීමේ රිට් පෙත්සම

තොරතුරු කොමිසමේ තීරණය ක්‍රියාත්මක නො වීම හේතුවෙන් තොරතුරු කොමිසමට එදිරිව පුරවැසියන් අභියාචනාධිකරණය හමුවේ අභියාචනා ගොනු කළ අවස්ථා ද දක්නට ලැබේ. තොරතුරු කොමිසමට විරුද්ධව අධිකරණය තුළ පුරවැසියෙකු පැවරූ පළමු නඩුව මේ වන විට අභියාචනාධිකරණයේ විභාග වෙමින් තිබෙන අතර එය පොළොන්නරුව ප්‍රාදේශීය වාර්තාකරුවෙකු වන එස්. එම් මනෝජ් ප්‍රසන්න මහතා විසින් පවරා ඇත.

උක් වගා කිරීමේ අරමුණින් තිස් වසරක් පුරා යුද්ධයක් පැවති තොප්පිගල බටහිර දෙසට මායිම් වන්නට පිහිටි මාදුරුඔය දකුණු ඉවුර ප්‍රදේශයේ ඉඩම් අක්කර 60,750 ක ප්‍රමාණයක් විදේශීය සමාගමකට පවරාදීමට එවකට පැවති ආණ්ඩුව 2016 වසර අගදී ගන්නා ලද කැබිනට් මණ්ඩල තීන්දුවකට අනුව එම සංවර්ධන ක්‍රියාවලිය ක්‍රියාවට නැංවීම නිසා මේ ප්‍රදේශයේ හේන් ගොවිතැනින් ජීවිකාව ගෙනගිය ගොවි පවුල් 2,000 කට සහ කිරි ගොවි කර්මාන්තයේ නිරත පවුල් 400 කට අහිමි වන ජීවිකාව රැකදීම සඳහා මෙන්ම, මෙම සංවර්ධන ව්‍යාපෘතියට ජලය සපයා ගැනීමට යෝජනා වී තිබෙන මාදුරුඔය ජලාශයෙන් ජලය ලබාගන්නා මාදුරුඔය වම් ඉවුර ප්‍රදේශයේ පවුල් 22,000 කට සිදුවන පාරිසරික බලපෑම් හේතුවෙන් මේ සම්බන්ධයෙන් යම් කතාබහක් ඇති වී තිබිණි. මේ නිසා පොළොන්නරුව ප්‍රදේශයේ පදිංචි මාධ්‍යවේදී එස්. එම්. මනෝජ් ප්‍රසන්න මහතා විසින් තොරතුරු පනත යටතේ මේ ව්‍යාපෘතියේ ව්‍යාපෘති යෝජක වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධනය සම්බන්ධයෙන් 2017.05.02 වන දින තොරතුරු ඉල්ලා සිටින ලදී.[26]

නමුත් තොරතුරු නිලධාරියා විසින් තොරතුරු ලබා දීමක් සිදු කොට නැති අතර ඉන් පසුව 2017.05.30 වන දින නම් කළ නිලධාරියා වෙත අභියාචනයක් යොමු කර ඇත. නමුත් එයට කිසිදු ප්‍රතිචාරක් ලැබී නොමැති අතර ඉන් පසුව ඔහු 2017.07.06 දින තොරතුරු කොමිසම වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත. ඉන් පසුව තොරතුරු කොමිසමේ දීර්ඝ විභාගයෙන් අනතුරුව අදාල පොදු අධිකාරිය විසින් තොරතුරු ඉල්ලුම්කරුට තොරතුරු ලබා දිය යුතු යැයි RTIC 97/2017 අභියාචනා නියෝගය මගින් තීරණය කරන ලදි.[27] නමුත් එම නියෝගය ක්‍රියාත්මක කරමින් මහවැලි අධිකාරිය තොරතුරු මුදාහැර තිබුණේ නැත.

එම නිසා තොරතුරු කොමිෂන් සභාව තම තීරණ ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම සහ මහවැලි අධිකාරිය තොරතුරු ලබා නො දීම යන කරුණු මූලික කර ගනිමින් එම ආයතන දෙකට එදිරිව මනෝජ් ප්‍රසන්න මහතා තොරතුරු දැන ගැනීමේ කොමිසමේ සභාපතිවරයා ඇතුළු සාමාජිකයන් සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, නීතිපතිවරයා ඇතුළු 11 දෙනෙකු වගඋත්තරකරුවන් කරමින් අභියාචනාධිකරණයේ රිට් පෙත්සමක් ගොනු කරන ලදි.

2021 පෙබරවාරි 19 වන දින අභියාචනාධිකරණයේදී විභාගයට ගත් මෙම අභියාචනයේ පෙත්සමේ එක් වගඋත්තරකාර පාර්ශ්වයක් වන තොරතුරු කොමිසම අභියාචනාධිකරණයට කරුණු දක්වා තිබුණේ අභියාචක ඉල්ලීම කළ තොරතුරු අභියාචකට මේ වනවිටත් ලබා දී තිබෙන බවයි. ඒ පිළිබඳ පෙත්සම්කරු සෑහීමකට පත් නො වන බවට කළ දැනුම් දීම අභියාචනාධිකරණය පිළිගත් අතර, මෙහි අනෙක් වගඋත්තරකාර පාර්ශ්වය වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට ද අභියාචනාධිකරණයේ පෙනී සිටින ලෙස නොතීසි නිකුත් කර ඇත. මේ සම්බන්ධව අභියාචන යොමු කළ මනෝජ් ප්‍රසන්න මහතා සඳහන් කර සිටියේ තොරතුරු පනත යනු අප රටේ පුරවැසියන්ට ලැබුණු ලොකුම වරප්‍රසාදයක් වුවත්, තවමත් බොහෝ රාජ්‍ය ආයතන නියමිත පරිදි ජනතාවට තොරතුරු දීමට කටයුතු කරන ආකාරයක් නොපෙනෙන බවයි.

මේ ආකාරයෙන් තොරතුරු ලබාදීම රාජ්‍ය ආයතන විසින් මගහරිනවා නම් තොරතුරු කොමිෂන් සභාව කළ යුතු වන්නේ ජනතාවට තොරතුරු ලබාගැනීමට උපකාර වීමයි. එනම් ජනතාවට තොරතුරු ලබාදෙන ලෙස පොදු අධිකාරීන්ට නියෝග කිරීම සහ ඒවා ක්‍රියාත්මක වීමේ වැඩපිළිවෙලක් නිසියාකාරව සකස්

[26] https://medialk.com/archives/4162

[27] http://www.rticommission.lk/web/images/pdf/rticap-peal-097-2017/rtic-97-2017-si-19122018.pdf

කිරීමයි. ඒ සඳහා තොරතුරු කොමිසම නීත්‍යානුකූලවම බැඳී සිටියි. එහෙත් තොරතුරු ලබා ගැනීමට නො හැකිව පුරවැසියෙකු කොමිසම ඉදිරියට ගිය විට, කොමිසම විසින් අවුරුද්දකට වැඩි කාලයක් විභාගය සිදු කරයි. එවිට තොරතුරු අයිතිය පිළිබඳව ජනතාවට කලකිරීමක් ඇතිවිය හැකිය. එපමණක් නොව තොරතුරු කොමිසම පිහිටා තිබෙන්නේ කොළඹ පමණි. යාපනය, පොළොන්නරුව, හම්බන්තොට ප්‍රදේශවල පුරවැසියෙකුට තොරතුරු කොමිසමේ නඩු විභාගවලට දීර්ඝ කාලයක් ගතකරමින් කොළඹ පැමිණීමට සිදු වුනොත්, ඔවුනට විශාල වියදමක් දරාගන්නට සිදුවේ. මෙම හේතුන් මත තොරතුරු අයිතිය ශක්තිමත් කිරීමට අවශ්‍ය නියෝගයක් ලබාගැනීම මූලික කර ගනිමින් තමා අධිකරණය වෙත ගිය බව මනෝජ් මහතා සඳහන් කර සිටියේය.[28]

තොරතුරු පනත කෙතරම් ප්‍රායෝගිකව භාවිත කළ හැකි වුවත් ඇතැම් රාජ්‍ය නිලධාරීන්ගේ තොරතුරු පනත පිළිබඳ අවබෝධය ඉතා අඩු ය. තොරතුරු පනත ඇත්තේ තොරතුරු ලබා නො දීමට හෝ තොරතුරු වසං කිරීමට නො වන අතර තොරතුරු පනත ක්‍රියාත්මක වී වසර 6 ක කාලයක් සම්පූර්ණ වී ඇතත් බොහෝ රාජ්‍ය නිලධාරීන් තුළ තවමත් ඇත්තේ පනත සම්මත කිරීමට පෙර පැවති තොරතුරු වසන් කිරීමේ මූලික සංස්කෘතියයි. බොහෝ ආයතන මේ වනවිට නිසි පරිදි තොරතුරු ලබා දුන්නද සමහර ආයතන තවමත් තොරතුරු ලබා දීමට අකමැත්තක් දක්වන බව ඉහත උදාහරණවලින් ද පැහැදිලි වේ. තොරතුරු කොමිෂන් සභාවට ගලා එන අභියාචන දෙස බැලූ විට එය හොඳින්ම පැහැදිලි වේ. එසේ පැමිණෙන අභියාචනා විභාග කිරීමට කොමිසමට දීර්ඝ කාලයක් ගත වීම අනෙක් ප්‍රධාන ගැටලුව වන අතර එයට ප්‍රධානත ම හේතුව අධික ලෙස අභියාචනා පැමිණීම ම නොවේ.

ආණ්ඩුවෙන් තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන නිසි පරිදි ලබා නො දීම ද ඊට හේතුවකි. තොරතුරු පනත ගෙන ආ පමණින් රජයට අත පිස දා ගත නොහැකිය. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය මුල්‍යමය ප්‍රතිපාදන කලට වේලාවට වෙන් කිරීම ද ආණ්ඩුවේ වගකීමකි. එමෙන්ම තොරතුරු ලබා දීමට මැලිකමක් දක්වන ආයතන හඳුනාගෙන ඒවායේ නිලධාරීන් දැනුම්වත් කරමින් තොරතුරු පනත ඉතා ප්‍රායෝගිකව භාවිතා කිරීමට ඔවුන් යොමු කිරීම ද ආණ්ඩුවේ වගකීමකි. එපමණක් නොව තොරතුරු ලබා දීමේ දී අය කරන ගාස්තුවල ද යම් වෙනස් කමක් සිදුවිය යුතු අතර වැඩි මුදලක් අය කිරීම සාමාන්‍ය පුරවැසියන් මෙම ක්‍රියාවලියෙන් ඈත් කිරීමට හේතු විය හැකි ය.

මෙවැනි ප්‍රායෝගික ගැටලු රැසක් තවමත් මෙම යාන්ත්‍රණය තුළ පවතින අතර තොරතුරු පනත ගම්මාන කරා ගමන් නොකිරීම ද තවත් එක් ප්‍රධාන අඩුපාඩුක් ලෙස දැක්විය හැක. මන්ද, මහජන දිනවල රාජ්‍ය නිලධාරීන් සහ දේශපාලකයන් ඉදිරිපිට ජනතාවට වැඳ වැටෙන්නට සිදු වී ඇත්තේ ඒ නිසාය. තොරතුරු පනතෙහි ප්‍රයෝගිකත්වය පිළිබඳ මීට වඩා ජනතාව දැනුම්වත් කළහොත් පනත ගෙන ඒමේ අභිලාශය යථාර්ථයක් බවට නිසැකයෙන්ම පත් වනු ඇත.


තොරතුරු පනත සම්මත වීමෙන් පසු තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව එහි ප්‍රධානත ම අංගයක් වූ අතර විවිධ හැල හැප්පීම් මතින් මේ දක්වා පැමිණ ඇත. 2017 පෙබරවාරි 03 වන දා ආරම්භ වීමෙන් පසුව 2018 සිට මේ දක්වා කොමිසම විසින් සිදු කළ විභාග කිරීම් සහ නිර්දේශ පිළිබඳ කෙටි විශ්ලේෂණයක් මගින් එහි ක්‍රියාකාරිත්වය ගැන යම් අවබෝධයක් ලබා ගැනීමට හැකිවනු ඇත.

---

28 https://medialk.com/archives/4162

# 8. විශ්ලේෂණය - 2018 සිට 2022 වර්ෂය දක්වා තොරතුරු දැන ගැනීමේ යාන්ත්‍රණයේ සහ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය

## 8.1 2018, 2019, 2020, 2021 වර්ෂයන් වල තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වූ අභියාචනා ප්‍රමාණය




[29]මූලාශ්‍රය- කාර්ය සාධන වාර්තාව 2021, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

ඉහත ප්‍රස්ථාරයෙන් දැක්වෙන්නේ 2018-2021 දක්වා ලැබුණු සම්පූර්ණ අභියාචනා සංඛ්‍යාව සහ සංසන්දනාත්මක ව එවැනි වර්ෂ අතර සමානුපාතික වෙනසයි. එහි දී වැඩිම අභියාචනා සංඛ්‍යාවක් 1089-42% 2019 දී ලැබුණු අතර අඩුම 729-28% 2020 දී ලැබී ඇත. එමෙන්ම මෙම තීරු ප්‍රස්ථාරය කොමිෂන් සභාව විසින් පරිපූර්ණ අභියාචනා සහ ප්‍රතික්ෂේප කරන ලද පරිපූර්ණ නොවන අභියාචනා ගණන නිරූපණය කරයි. 2018 වර්ෂයේ සිට කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරන ලද අභියාචනා සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු වී ඇති බව ප්‍රස්ථාරයෙන් පෙන්නුම් කරයි. පරිපූර්ණ අභියාචනා සහ ප්‍රතික්ෂේප වූ අභියාචනා අතරින් 2018 දී අභියාචනාවලින් 44% ක් ප්‍රතික්ෂේප වූ අතර 2019 දී 33%ක් ප්‍රතික්ෂේප වී ඇත. 2020 දී ප්‍රතික්ෂේප වූයේ 26%ක් පමණි. 2021 දී ලද අභියාචනා වලින් 68%ක් පරිපූර්ණ අභියාචනා ලෙස හඳුනාගෙන ඇති අතර 22%ක් පරිපූර්ණ නොවන අභියාචනා ලෙස ප්‍රතික්ෂේප වී ඇත.

## 8.2 අසා අවසන් කරන ලද සහ කල් දැමූ අභියාචනා ගණන

කොමිෂන් සභාව 2021 දී අභියාචනා 937ක් විභාග කළ අතර 2020 දී අභියාචනා 999ක් විභාග කරන ලදී. තවද, 2020 දී අභියාචනා 472ක් කල් තැබිණි/අර්ධ වශයෙන් විභාග කරන ලදී. එමෙන්ම 2021 දී කොමිසම විසින් අභියාචනා 495 ක් කල් තැබිණි/අර්ධ වශයෙන් විභාග කරන ලැබූ අතර කොමිසම 2021 දී අවසන් නියෝග 475ක් (ඉවත් කිරීම් 59ක් ඇතුළුව) ලබා දීම සිදු කර ඇත.

[29] https://www.rticommission.lk/web/images/pdf/Re--edited-2021---English---Draft-RTIC-Performance-Report---21.10.2022-1.pdf

## 8.3 කොමිසමේ විනිශ්චය

| වර්ෂය | පරිපූර්ණ අභියාචනා සංඛ්‍යාව | සාර්ථකව අවසන් කළ අභියාචනා සංඛ්‍යාව |
|---|---|---|
| 2017 | 230 | 57 |
| 2018 | 800 | 549 |
| 2019 | 1089 | 709 |
| 2020 | 729 | 427 |
| 2021 | 825 | 475 |

[30]මූලාශ්‍රය - කාර්ය සාධන වාර්තාව 2021, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

එමෙන්ම 2017 පෙබරවාරි 3 වැනි දින ක්‍රියාත්මක වීම ආරම්භ වූ දා සිට අවසන් කළ මුළු නඩු සංඛ්‍යාවෙන් පාර්ශවයන් එකොළොස් දෙනෙකු පමණ 2021 දෙසැම්බර් වන විට කොමිෂන් සභාවේ නියෝගවලට එරෙහිව අභියාචනාධිකරණයට අභියාචනා ඉදිරිපත් කර ඇත.

## 8.4 2021.12.20 වනදා සිට 2022.12.31 වනදා දක්වා කොමිෂන් සභාවේ අභියාචනා විභාගය පිළිබඳ සංඛ්‍යා ලේඛනය


| | | | | |
|---|---|---|---|---|
| සාරාංශය | | | | |
| සම්පූර්ණයෙන්ම අවසන් | | | නව අභියාචනා ගණන | මුළු එකතුව |
| සම්පූර්ණ තොරතුරු ලබා දීම | 880 | 1451 | | |
| අර්ධ වශයෙන් තොරතුරු ලබා දීම | 70 | | | |
| තොරතුරු ලබා දීම | 252 | | | |
| වෙනත් | 73 | | 2023 දී විභාගය සඳහා ලැයිස්තුගත කර ඇති සංඛ්‍යාව | |
| ප්‍රතික්ෂේප කිරීම් | 70 | | | |
| නිෂ්ප්‍රභා කිරීම් | 106 | | | |
| බහා තබන ලද අභියාචනා | | 14 | | |
| 2022.12.31 දිනට කල් තබන ලද අභියාචනය | | 124 | | |
| මුළු සංඛ්‍යාව | | 1589 | 380 | 1969 |

[31]මූලාශ්‍රය - කොමිෂන් සභා අභියාචනා විභාග වාර්තාව 2022, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

[30] https://www.rticommission.lk/web/images/pdf/Re--edited-2021---English---Draft-RTIC-Performance-Report---21.10.2022-1.pdf

[31] http://www.rticommission.lk/web/images/pdf/Statics-2022/Statistics-20.12.2021---31.12.2022.pdf

## 8.5 2022 වර්ෂයේ කොමිෂන් සභාවේ අභියාචනා විභාගය





සමස්ත වශයෙන් පසුගිය වර්ෂ කිහිපය තුළදී තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිසමේ ක්‍රියාකාරිත්වය සහ පුරවැසියන් තම තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම යටතේ කොමිසම සමග ගනු දෙනු කළ ආකාරය පිළිබඳ දළ අදහස ලබා ගැනීමට ඉහත සංඛ්‍යාත්මක දත්ත උපකාර වේ. 2022 වර්ෂය තුළ කොමිසම වෙත ඉදිරිපත් වූ අභියාචනා හමුවේ කොමිසම ඔවුන්ගේ බලතල අනුව සම්පූර්ණ තොරතුරු ලබාදීම් 880 - 45%ක්, අර්ධ වශයෙන් තොරතුරු ලබාදීම් 70 - 3%ක්, තොරතුරු ලබා දීම් 253 - 13%ක්, ප්‍රතික්ෂේප කිරීම් 70 - 4%ක්, නිෂ්ප්‍රභා කිරීම් 106 - 5%ක්, බහා තබන ලද අභියාචනා 14 - 1%ක්, කල් තබන ලද අභියාචනා 124 - 6%ක්, වෙනත් 73 - 4%ක් සහ 2023 දී විභාගය සඳහා ලයිස්තු ගත කර ඇති සංඛ්‍යාව 380 - 19%ක් වන බව නිරීක්ෂණය වේ.

2022 ජනවාරි මස සිට 2023 පෙබරවාරි මස දක්වා කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය, නිර්දේශ, ඒවා ක්‍රියාත්මක වන ආකාරය සම්බන්ධයෙන් 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ තොරතුරු නිලධාරීයාගෙන් තොරතුරු ඉල්ලුම් කළ ද එම ඉල්ලුම් කිරීම සම්බන්ධව කිසිදු ප්‍රතිචාරයක් කොමිෂන් සභාව විසින් මේ දක්වා සිදු කර නොමැත. ඉන්පසු තොරතුරු ලබා ගැනීමේ ක්‍රියාපටිපාටියට අනුකූලව තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ නම් කළ නිලධාරියා වෙත අභියාචනය සිදුකර ඇති අතර ඒ සඳහා ද මෙතෙක් කිසිදු පිළිතුරක් ලැබී නොමැත.

මෙම කාලසීමාව තුළදී ද මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථානයන් තොරතුරු දැන ගැනීමේ පනත පිළිබඳව මහජනතාව දැනුවත් කරමින් ඔවුන්ගේ ගැටලු සඳහා තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ පොදු අධිකාරීන් මගින් තොරතුරු ඉල්ලුම් කිරීමට සෑම ප්‍රදේශයකම පාහේ මහජනතාව පෙළඹවීමට මූලිකව කටයුතු කර ඇත.


## 8.6 2022 වර්ෂයේ මැයි මස සිට 2023 වර්ෂයේ පෙබරවාරි මස දක්වා මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථාන හරහා දිස්ත්‍රික්ක අනුව තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පනත යටතේ සිදු කළ තොරතුරු ඉල්ලීම් සහ අභියාචනා




මූලාශ්‍රය - ඇමුණුම 01

මෙහිදී තහවුරු කර ගත් දත්තයන්ට අනුව සලකා බැලීමේදී දිස්ත්‍රික්ක 08ක් අතුරින් තොරතුරු ඉල්ලීම් 75ක් හඳුනාගත හැකිවිය. ඒ අනුව මොණරාගල දිස්ත්‍රික්කයෙන් 24ක් ද, මාතර දිස්ත්‍රික්කයෙන් 23ක් ද, ගාල්ල දිස්ත්‍රික්කයෙන් 11ක් ද, කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් 07ක් ද, අනුරාධපුර දිස්ත්‍රිකයෙන් 04ක් ද, ගම්පහ දිස්ත්‍රික්කයෙන් 03ක් ද, පුත්තලම දිස්ත්‍රික්කයෙන් 02ක් ද සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන් 01ක් ද වශයෙන් පොදු අධිකාරීන් වෙත තොරතුරු ඉල්ලීම් යොමු කොට ඇත.

**තොරතුරු ඉල්ලීම් සිදු කොට ඇති ක්ෂේත්‍ර**





එසේ තොරතුරු ඉල්ලීම් සිදු කොට ඇති ක්ෂේත්‍ර 03ක් ද මෙහිදී හඳුනාගත හැක. එනම්, ඉඩම් වලට අදාළ තොරතුරු, රාජ්‍ය පරිපාලනයට අදාළ තොරතුරු සහ මානව හිමිකම් කාරණා සම්බන්ධ තොරතුරු වශයෙනි. ඒ අනුව සමස්ථ දිස්ත්‍රික්ක 08 ම සැලකිල්ලට ගැනීමේදී රාජ්‍ය පරිපාලනය සම්බන්ධ කාරණා සම්බන්ධයෙන් සිදු කොට ඇති තොරතුරු ඉල්ලීම් ප්‍රමාණය 71%ක ප්‍රතිශතයක් වන බවද, ඉඩම් සම්බන්ධයෙන් සිදුකරන

ලද තොරතුරු ඉල්ලීම් ප්‍රමාණය 24%ක ප්‍රතිශතයක් වන බව ද සහ මානව හිමිකම් ක්ෂේත්‍රයට අදාළව සිදු කර ඇති තොරතුරු ඉල්ලීම් ප්‍රමාණය 5%ක ප්‍රතිශතයක් වන බවද නිරීක්ෂණය වේ.

මෙහිදී ඉහත දිස්ත්‍රික්ක සියල්ලම සැලකීමේදී සාපේක්ෂව ගත් විට වැඩිම තොරතුරු ඉල්ලීම් ප්‍රමාණයක් යොමු කොට ඇත්තේ රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වන බැවින් එය තවදුරටත් පරික්ෂා කිරීමේදී නිරීක්ෂණය වන්නේ එම ක්ෂේත්‍රයට අදාළව වැඩිම තොරතුරු ඉල්ලීම් ප්‍රමාණයක් යොමු කොට ඇත්තේ මාතර දිස්ත්‍රික්කයෙන් වන බවත් එම සංඛ්‍යාව ප්‍රතිශතයක් වශයෙන් ගත් කළ 38%ක ප්‍රමාණයකි. දෙවනුවට එකී රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රයට අදාළව වැඩි ප්‍රතිශතයක් තොරතුරු ඉල්ලීම් යොමු කොට ඇත්තේ මොණරාගල දිස්ත්‍රික්කය වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් ගත් විට 28%කි.

තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ පළමුව තොරතුරු ඉල්ලීම සිදු කළ යුත්තේ අදාළ පොදු අධිකාරියේ තොරතුරු නිලධාරියාගෙනි. ඔහුගෙන් තොරතුරු නො ලැබුණි නම් හෝ ලැබුණු තොරතුරු සම්බන්ධයෙන් සෑහීමට පත් නොවේ නම් දෙවනුව එම පොදු අධිකාරියේම සිටින නම් කළ නිලධාරි වෙත අදාළ කාල සීමාව දින 14 තුළදී අභියාචනා කළ යුතුය. එමගින් ද සෑහීමට පත් විය හැකි තොරතුරක් නො ලැබෙයි නම් මාස 02ක් ඇතුලත තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනා කළ යුතු අතර එමගින්ද සෑහීමට පත්විය හැකි තොරතුරු නො ලද නම් මසක් ඇතුලත අභියාචනාධිකරණය වෙත එනම් අධිකරණ ක්‍රියාමාර්ග වෙත යොමු වීමට හැකියාව මෙම පනත හරහා සලසා ඇත. ඒ අනුව ඉහත තොරතුරු ඉල්ලීම් සලකා බැලීමේදී පළමුව තොරතුරු නිලධාරි වෙත යොමු කළ තොරතුරු ඉල්ලීම්වලින් 62% ක ප්‍රතිශතයක් සම්බන්ධයෙන් තොරතුරු නිලධාරි විසින් ප්‍රමාණවත් තොරතුරු ලබා දීම සිදු කොට ඇති අතර 25% ක ප්‍රතිශතයක් සම්බන්ධයෙන් තොරතුරු නිලධාරි විසින් ප්‍රමාණවත් තොරතුරු ලබා දීම සිදු කොට නොමැති බව නිරීක්ෂණය වේ.

**තොරතුරු නොලද ඉල්ලීම් සඳහා අභියාචනා කළ/නොකළ ප්‍රමාණය**





ඉහත තොරතුරු නිලධාරි විසින් ප්‍රමාණවත් තොරතුරු ලබා නොදුන් 25%ක ප්‍රමාණය තව දුරටත් සලකා බැලීමේදී ඉන් 32%ක ප්‍රතිශතයක් නම් කළ නිලධාරි වෙත අභියාචනා ඉදිරිපත් කිරීම සිදු කර තිබෙන අතර ඉතිරි 68%ක ප්‍රමාණය ඉල්ලුම්කරු නැතහොත් වින්දිතයා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සිදු කොට නොමැති බව නිරීක්ෂණය වේ. මින් නම් කළ නිලධාරි වෙත අභියාචනා යොමු කර ඇති ප්‍රමාණය තවදුරටත් සලකා බැලීමේදී ඉන් 50%ක ප්‍රතිශතයක් සඳහා නම් කළ නිලධාරි මගින් ප්‍රමාණවත් තොරතුරු ලැබී ඇති

අතර ඉතිරි 50%ක ප්‍රමාණය සඳහා අදාළ තොරතුරු නිසියාකාරව ලැබී නොමැති බව නිරීක්ෂණය වේ.

එසේ නම් කළ නිලධාරි විසින් අදාළ තොරතුරු නිසියාකාරව ලබා දී නොමැති ප්‍රමාණය තවදුරටත් සලකා බැලීමේදී නිරීක්ෂණය වන්නේ ඒවා සියල්ලම සම්බන්ධයෙන් ඉල්ලුම්කරුවන් විසින් තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත නිසියාකාරව අභියාචනා සිදු කොට ඇති බවයි. එම අභියාචනා තවදුරටත් සලකා බැලීමේදී නිරීක්ෂණය වන්නේ ඉන් 67%ක ප්‍රතිශතයක් තවමත් කොමිසම මගින් විමර්ශනයට ලක් කොට නොමැති බවත් ඉතිරි 33%ක ප්‍රමාණය සඳහා කොමිසම මගින් අදාළ පාර්ශවකරුවන් කැඳවා නිසියාකාරව විමර්ශන පැවැත්වීමෙන් අනතුරුව ප්‍රමාණවත් තොරතුරු ඉල්ලුම්කරු වෙත ලැබීම සිදු වී ඇති බවයි.

**යොමු කරන ලද තොරතුරු ඉල්ලීම්වලට කුමන හෝ ප්‍රතිචාරයක් ලැබුණු හෝ නොලැබුණු ගණන**




ඉහත දැක්වූ ආකාරයට මෙය විශ්ලේෂණය කිරීමේදී පෙනී ගිය කරුණක් වන්නේ තොරතුරු ඉල්ලා සිටි ඉල්ලුම්කරුවන් අතුරින් 13%ක ප්‍රමාණයක් තොරතුරු නිලධාරිගෙන් ප්‍රතිචාරයක් නොමැති විට හෝ ප්‍රමාණවත් තොරතුරු නො ලද විට ඊට එරෙහිව පනතේ විධි විධාන යටතේ ඉහළට අභියාචනා ඉදිරිපත් කිරීම සිදු නොකොට එම ක්‍රියාවලිය අතහැර දමා ඇති බවයි. කෙසේ වෙතත් ඉහත විශ්ලේෂණය තුළින් තවදුරටත් අනාවරණය වන්නේ ඉහත සමස්ථ දිස්ත්‍රික්ක 08 න් ඉදිරිපත් කොට ඇති තොරතුරු ඉල්ලීම් වලින් 67%ක ප්‍රතිශතයක් සඳහා ප්‍රමාණවත් තොරතුරු ලැබී ඇති අතර 20%ක ප්‍රතිශතයක් සඳහා ප්‍රමාණවත් තොරතුරු ලැබී නොමැති බවයි. එසේම සමස්ථ දිස්ත්‍රික්ක 08 න් 13%ක ප්‍රතිශතයක ඉල්ලුම්කරුවන් මෙම තොරතුරු දැන ගැනීමේ පනත යටතේ වූ අභියාචනා ක්‍රියාවලියට අවතීර්ණ වීම පැහැර හැර තිබෙන බවද නිරීක්ෂණය වේ.

මෙම කාලසීමාව තුළදී මොණරාගල දිස්ත්‍රික්කය වැඩිම තොරතුරු ඉල්ලුම් ප්‍රමාණයක් පොදු අධිකාරීන් වෙත යොමු කළ දිස්ත්‍රික්කය බව නිරීක්ෂණය වන අතර එහිදී මහජනතාව ට මෙම ක්‍රියාවලිය සඳහා මනා සහයෝගය ලබා දුන් මොණරාගල දිස්ත්‍රික් මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථානයේ සම්බන්ධීකාරක එච්. එල්. අචල පියුමන්ත මහතා තම අත්දැකීම් ප්‍රකාශ කර සිටියේ මෙලෙසිනි.

> "තොරතුරු දැන ගැනීමේ යාන්ත්‍රණයේදී 70% පමණ පොදු අධිකාරීන් මේ වන විට තොරතුරු ලබා දීම සිදු කරන නමුත් ඒ සඳහා ලබා ගන්නා දීර්ඝ කාලය තොරතුරු ඉල්ලුම්කරුගේ උනන්දුව

හීන වීමට බලපාන බවයි. එමෙන්ම පොදු අධිකාරීන් තුළ තොරතුරු පනත සම්බන්ධව තවමත් ඇති අවම දැනුවත්භාවය සහ නො සැලකිලිමත්කම යම් අවස්ථාවලදී තොරතුරු ලබා නොදී සිටීමට හේතු වී ඇති බවද පවසා සිටියා. ස්වාධීන කොමිෂන් සභා අතරින් යම් මට්ටමක හෝ කාර්යක්ෂමතාවයකින් කටයුතු කරන කොමිෂන් සභාව ලෙස තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව හැඳින්විය හැකි නමුත් බොහෝ විට කොමිසමට යොමු කරන අභියාචනා විභාග කිරීම හෝ ඒ සම්බන්ධව ප්‍රතිචාර දැක්වීමට දීර්ඝ කාලයක් ගත කිරීම එහි ඇති ප්‍රධාන ගැටලුව බව කියා සිටියා. එපමණක් නොව ඒ සම්බන්ධව විමසීම සඳහා ලබා දී ඇති දුරකතන අංක නිසි ලෙස ක්‍රියාත්මක නො වීමට ද තවත් එක් දුර්වලතාවයක් ලෙස සඳහන් කළේ ය.

එමෙන්ම තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සහ එම යාන්ත්‍රණය පිළිබඳ පුරවැසියන්ගේ උනන්දුව සහ විශ්වාසය එතරම් සුබදායක නොමැති බව කියා සිටි අතර එයට මූලික හේතුව ලෙස සඳහන් කර සිටියේ රාජ්‍ය යාන්ත්‍රණයේ ඇති අකාර්යක්ෂමතාව නිසා මේ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතද ඒ අයුරින්ම ක්‍රියාත්මක වෙන තවත් එක් පනතක් යන මතය ජනතාව සතුව පැවතීම බවයි. ජනතාවගෙන් 1%ක් 2%ක් පමණ පිරිසකට මේ සම්බන්ධව නිසි අවබෝධයක් ඇති නමුත්, බොහෝ පිරිසකට මෙහි නිසි ඵල නෙලා ගැනීමට නිසි අවබෝධයක් සහ දැනුවත්භාවක් නොමැති වීමත් තවත් එක් සාමාජීය දුර්වලතාවයක් ලෙස ප්‍රකාශ කර සිටියා. එම දුර්වලතාවය මඟ හරවා ගැනීමට සිවිල් ක්‍රියාකාරීන් ලෙස අපටද රජයටද නිසි දැනුවත් කිරීමේ වැඩපිළිවෙළක් අත්‍යාවශ්‍යම කාරණය බවද ඔවුන් පවසා සිටියා.

පොදු අධිකාරීන්ගේ ක්‍රියාකාරිත්වයේ ඇති විශාලතම ගැටලු නම් මෙම ක්‍රියාවලිය හා සම්බන්ධ නිලධාරීන්ට කලින් කලට නිසි පුහුණුව ලබා නො දීමයි. තොරතුරු පනත ක්‍රියාත්මක වූ මුල් වකවානුවේ ලබා දුන් පුහුණුවට පසු නැවත ඔවුන්ගේ දැනුම යාවත්කාලීන වන ආකාරයේ නිසි පුහුණුවක් ලබා නො දීම නිසා මෙම පනත සහ එම චක්‍ර ලේඛයන් පරිශීලනය කිරීමක් හෝ ඒ සම්බන්ධව දැනුම යාවත්කාලීන වීමක් ඔවුන් තුළ සිදු වන්නේ නැත. ඒම නිසා පනත මගින් පුරවැසියන් ලැබෙන ප්‍රතිලාභ සීමා වන අතර තොරතුරු ඉල්ලුම් කිරීමේ අභිලාෂය සාර්ථක කර ගැනීමට නොහැකි වන බවද කියා සිටියා. බොහෝ අවස්ථාවල නිලධාරීන් තුළ පනත සම්බන්දයෙන් ඇති අඩු සාක්ෂරතාවය නිසා ලබා දිය හැකි තොරතුරු ද වසන් කරමින් තොරතුරු ලබා නොදී සිටිමට හෝ සාවද්‍ය තොරතුරු ලබාදීමට උත්සහ කරන බවද කියා සිටියා. ඒම නිසා මෙම දුර්වලතා මඟ හරවා ගැනීමට නම් රාජ්‍ය නිලධාරීන්ට මෙන්ම රටේ පුරවැසියන්ටද තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සම්බන්ධව ඉතා හොඳ දැනුවත්භාවයක් ලබාදීම කාලීන අවශ්‍යතාවයක් බව අවසන් වශයෙන් ඔහු පවසා සිටියා."

# සමාප්තිය සහ නිර්දේශ

මෙම අධ්‍යයනය අනුව අපට නිරීක්ෂණ වන කරුණ නම් තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ක්‍රියාත්මක වී වසර 6 ක් සම්පූර්ණ වී ඇතත්, තවමත් මේ යාන්ත්‍රණය තුළ යම් යම් අඩුලුහුඩුකම් පවතින බවයි. එහි දී නිරීක්ෂණය වන ප්‍රධානත ම කාරණා කිහිපයක් ඇත.

පුරවැසියන් තොරතුරු ඉල්ලීම් කළ ද හුදෙක් පොදු අධිකාරීන් වල බලයලත් නිලධාරීන් එය කඩිනමින් ලබා දීමට උත්සුක නො වීම ඒ අතර ප්‍රධාන වේ. ඊයට හේතුව වන්නේ ඔවුනට මේ පනත පිළිබඳ නිසි දැනුවත්භාවයක් නොමැති වීම සහ නො සැලකිලිමත් බවයි. එසේ දැනුවත්භාවයක් තිබුණා නම් පුරවැසියාගේ තොරතුරු දැන ගැනීමේ අයිතිය සුරක්ෂිත කල යුත්තේ ඇයි ද සහ එසේ පැහැර හැරීමෙන් ඔවුනට ලැබෙන දඬුවම නිසාත් ඔවුන් නිසි ආකාරයෙන් තොරතුරු ලබා දීමට කටයුතු කරයි.

ඒ ආකාරයෙන් පොදු අධිකාරීන් විසින් නිසි ලෙස තොරතුරු ලබා දෙනවානම් තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිසමේ මෙතරම් අභියාචනා ගොන්නක් ගොඩ ගැසෙන්නේ නැත. අනෙක් අතින් පොදු අධිකාරීන් පූර්ව තොරතුරු මුදාහැරීම නිසි ලෙස සිදු කරනවානම් එවිට ද මේ ආකාරයෙන් තොරතුරු දැන ගැනීමට මහත් වෙහෙසක් දැරීමට අවශ්‍යතාවයක් මතු වන්නේ නැත.

තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිසම ද අභියාචනයකට ප්‍රතිචාර දක්වා විමර්ශනක් සිදු කිරීමට විශාල කාලයක් ගැනීම හරහා සිදු වන්නේ තොරතුරු ඉල්ලුම්කරුට තොරතුරු අවැසි මොහොතේ තොරතුරු නො ලැබී යාමයි. එම නිසා කොමිසමේ ක්‍රියාවලිය තවදුරටත් කාර්යක්ෂම අන්දමට සිදු කළ හැකි යාන්ත්‍රණයක් සැකසෙනවානම් මෙම පනතෙත්, කොමිසමෙත් සැබෑ අරමුණ සඵල කර ගැනීමට හැකිවනු ඇත.

අනෙක් අතින් වසර ගණනක් ගෙවී ගිය ද පුරවැසියන් තුළ මේ පනත පිළිබඳ තවමත් පෙනෙන්නට ඇත්තේ එතරම් ධනාත්මක පැතිකඩක් නොවේ. ඉහත අධ්‍යනයෙන්ද පෙනී යන්නේ බොහෝ පුද්ගලයන් මෙම ක්‍රියාවලිය නිසි ලෙස අනුගමනය කර නොමැති බව ය. එයට මූලික හේතුව ලෙස පෙනෙන්නට ඇත්තේ පුරවැසියන් තුළ මෙම පනත සහ එහි ක්‍රියාවලිය සම්බන්ධව නිසි දැනුවත්භාවයක් නොමැති වීම යි. තොරතුරු නිලධාරියාගෙන් පිළිතුරු නො ලද පසු, කාලයත් සමඟ අවශ්‍යතාව හීන වී යෑම නිසා පුරවැසියන් ඊලඟ පියවරක් ගැන නො සිත යි. බොහෝ අය කළ යුතු දේ දන්නේද නැත. ඒම නිසා තොරතුරු දැන ගැනීමේ යාන්ත්‍රණය සවිමත් කරනවා සේම පුරවැසියාගේ දැනුවත්භාවය සහ සහභාගිත්වය ඉහළ නැංවීමට නිශ්චිත වැඩ පිළිවෙළක් සැකසීම අත්‍යවශ්‍යම කරුණක් බව මනාව පැහැදිලි වේ.

ඒ අනුව මෙම අධ්‍යනයේදී හමු වූ කරුණු මත පදනම්ව තොරතුරු දැන ගැනීමේ යාන්ත්‍රණය තවදුරටත් විධිමත් හා පුළුල් කිරීම සඳහා පහත නිර්දේශයන් ඉදිරිපත් කරමු.

1. සංවර්ධන උපායමාර්ග වැඩි දියුණු කරන රාජ්‍ය ප්‍රතිපත්ති සමඟ තොරතුරු දැන ගැනීමේ අයිතියට සහය වන ආයතනකික ව්‍යුහ සහ සම්බන්ධීකරණ ක්‍රියාවලි ශක්තිමත් කරන වැඩපිළිවෙලක් නිර්මාණය කිරීම.
2. තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ රාජ්‍ය නිලධාරීන් සඳහා පුහුණු වීම් ලබා දීම වඩාත් විධිමත් කිරීම හා නීතියේ වර්ධනයන් පිළිබඳ ඔවුන් තවදුරටත් දැනුම්වත් කිරීම.
3. තොරතුරු අයිතිය සහ තොරතුරු ලබා දීමේ ක්‍රියාවලිය රාජ්‍ය සේවා නිලධාරීන්ගේ පොදු පුහුණු කිරීම් සඳහා ඇතුළු කර සියලු අලුතෙන්

බඳවා ගන්නා රාජ්‍ය නිලධාරීන්ට ද ඒ සම්බන්ධ පුහුණුව ලබා දීම.

4. පොදු අධිකාරීන්වල තොරතුරු නිලධාරින්, නම් කළ නිලධාරින්, උසස් නිලධාරින් හට තොරතුරු ලබා දීමට සහ ආයතනික තොරතුරු පූර්ව හෙළිදරව් කිරීමට පුහුණු කිරීම.

5. ප්‍රගාමී තොරතුරු හෙළිදරව් කිරීම රාජ්‍ය නිලධාරීන්ගේ සහ ආයතනයන්ගේ පරිචයක් බවට පත් කිරීම.

6. තොරතුරු අයිතිය ක්‍රියාත්මක වීම සඳහා පොදු අධිකාරීන් තුළ තොරතුරු ආරක්ෂා වී තිබිය යුතු අතර ඒ සඳහා සෑම පොදු අධිකාරියක්ම ලේඛන ගත කිරීමට අමතරව මාර්ග ගත තොරතුරු දත්ත ගබඩාවක් ස්ථාපනය කර පවත්වාගෙන යාමට කටයුතු කිරීම.

7. තොරතුරු පනතේ ක්‍රියාකාරිත්වයට බාධා පමුණුවන වෙනත් පනත්, නීති රෙගුලාසි ලිහිල් කොට තොරතුරු දැන ගැනීමේ අයිතිය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම.

8. පුරවැසියන්ගේ දැනුවත්භාවය වැඩි කිරීමට සහ සහභාගිත්වය ඉහල නැංවීමට රට පුරා දැනුවත් කිරිමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

9. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවට පැමිණෙන අභියාචනා විභාග කිරීමේ කාර්යක්ෂමතාව ඉහලා නැංවීමට නිශ්චිත වැඩපිළිවෙළක් සැලසුම් කිරීම. ප්‍රධාන කාර්යාලය මූලික කරගත් පලාත් කාර්යාල ස්ථාපනය කිරීම.

10. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව විසින් ලබා දෙන නිර්දේශ නිසි ආකාරයෙන් ක්‍රියාත්මක වනවාදැයි සොයා බැලීමට පසු විපරම් නිරීක්ෂණ පද්ධතියක් ක්‍රියාවලියට ඇතුළත් කිරීම.

11. නව දියුණු තාක්ෂණය තොරතුරු ඉල්ලීම, ලබා දීම මෙන්ම තොරතුරු කොමිෂන් සභාවේ විමසීම් කටයුතු සඳහා ද යොදා ගෙන ප්‍රමාදයන් අවම කිරීමට කටයුතු කිරීම.

12. තොරතුරු කොමිසමේ විමසීම් මාර්ග ගත තාක්ෂණය වෙත ගෙන එමින් ප්‍රාදේශිය වශයෙන් දුරස්ථ ප්‍රදේශයන් හි වෙසෙන ඉල්ලුම්කරුවන් හට විමසීම් සඳහා ප්‍රවේශය වඩා පහසු කිරීම සහ ඒ මගින් තොරතුරු කොමිසමේ විමසීම් කඩිනම් කිරීම.

# ආශ්‍රිත මූලාශ්‍ර නාමාවලිය


### වෙබ් අඩවි

1. යතුර අතට දෙන තොරතුරු පනත. (n.d.). Online Sinhala News Site in Sri Lanka. https://yukthiya.lk/9958-2/

2. *About RTI – Right To Information – Sri Lanka.* (n.d.). https://rti.gov.lk/rti-unit/

3. User, S. (n.d.). *Right to Information Commission of Sri Lanka - නීති අසන පැන.* http://www.rticommission.lk/web/index.php?option=com_content&view=article&id=8&Itemid= 111&lang=si

4. තොරතුරු දැන ගැනීමේ පනත හා තක්කඩි (n.d.). https://www.lankadeepa.lk/features/%E0%B6%AD%E0%B6%BB%E0% B6%AD%E0%B6%BB-%E0%B6%AF%E0%B6%B%E0%B6%9C%E0%B6%B1%E0%B6%B8-%E0 %B6%B4%E0%B6%B1%E0%B6%AD-%E0%B7%84-%E0%B6%AD%E0%B6%9A%E0%B6%9A%E0%B6%A9/2-528842#adahas

5. සංස්කාරක. (2021, March 15). *සීනි ව්‍යාපෘතියේ තොරතුරු : මහවැලියට එරෙහිව නඩු පවරන්නැයි ඉල්ලයි : තොරතුරු කොමිසමට එරෙහිව පළමු නඩුව පවරයි! - MediaLK.* MediaLK. https://medialk.com/archives/4162

### ග්‍රන්ථ

1. කාර්ය සාධන වාර්තාව 2021, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව. https://www.rticommission.lk/web/images/pdf/Re--edited-2021---English---Draft-RTIC-Performance-Report---21.10.2022-1.pdf

### ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ පනත්

1. 20 වන අණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. https://www.parliament.lk/uploads/acts/gbills/sinhala/6176.pdf

2. 21 වන අණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. https://www.parliament.lk/files/pdf/constitution-si.pdf

3. 2017 පෙබරවාරි ජනවාරි 20 දිනැති අංක (2002/42) දරන ගැසට් (අතිවිශේෂ) නිවේදනය. http://documents.gov.lk/files/egz/2017/1/2002-42_S.pdf

4. 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවසිකම පිළිබඳ පනත. http://www.rticommission.lk/web/images/pdf/act/rti-act-si-13122018.pdf

## කොමිසමේ තීරණ සහ නඩු තීන්දු


1. RTI 719/2018.http://www.rticommission.lk/web/images/pdf/0719-2018/5.-RTIC-Appeal-Documentary-In- Person-Hearing-719-2018--.---.pdf
2. RTIC 97/2017. http://www.rticommission.lk/web/images/pdf/rticappeal-097-2017/rtic-97-2017-si-19122018.pdf
3. (2021)CA/RTI/0004/2021.https://www.rticommission.lk/web/images/pdf/Court_2023/Chamara_Samapath_Vs_SL_Parliament.pdf

# ඇමුණුම 1

| තොරතුරු ඉල්ලුම් කළ පුද්ගලයා සහ දිස්ත්‍රික්කය | | තොරතුරුවල ස්වභාවය | | | තොරතුරු ඉල්ලුම් කළ දිනය | තොරතුරු ඉල්ලුම් කළ පොදු අධිකාරිය | ප්‍රමාණවත් තොරතුරු ලැබී තිබේද? | නම් කරන ලද නිලධාරී වෙත අභියාචනා යොමු කළ තිබේද? | ප්‍රමාණවත් තොරතුරු ලැබී තිබේද? | තොරතුරු කොමිසම වෙත අභියාචනා යොමු කළ තිබේද? | විමර්ශණ සහ නිර්දේශ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඉඩම් | පරිපාලන | මානව හිමිකම් | | | | | | | |
| 1. | ඒ.එම් පොඩි මහත්තයා මොණරාගල | | | X | 2022/05/24 | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 2. | එම්. පී මෛත්‍රීපාල මොණරාගල | X | | | 2022/05/07 | ප්‍රාදේශිය මහා ලේකම් කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 3. | ආර්. එම් නිශාන් ඉමංක මොණරාගල | | X | | 2022/06/20 | සමෘධි මහා සංගමය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී නැත. | වින්දිතයා එම තොරතුරු ඉල්ලීම් ඉදිරියට ගෙන යාමට නොහැකි බව දැන්විය. | - | - | - |
| 4. | එච්. එල්. අචල පියුමන්ත මොණරාගල | | X | | 2022/06/23 | ප්‍රදේශීය ලේකම් කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 5. | ටී. ඩබ්ලිව්. රම්‍යලතා මොණරාගල | | X | | 2022/07/30 | ප්‍රදේශීය ලේකම් කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 6. | එස්. දිනූෂා සෙව්වන්දි මොණරාගල | | X | | 2022/07/30 | ලංකා විදුලිබල මණ්ඩලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 7. | කේ. ඒ. ඉසුරු එරන්ද මොණරාගල | | X | | 2022/08/06 | මාර්ග සංවර්ධන අධිකාරිය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී නැත. | ඔව් | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - |
| 8. | ටී.ඩබ්ලිව්. නයන වසන්ති මොණරාගල | X | | | 2022/08/23 | වැල්ලවාය ප්‍රාදේශිය සභාව | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 9. | ඊ.කේ නිර්මලා කුමාරි මොණරාගල | X | | | 2022/09/13 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 10 | ආර්.එම්. ඉන්දික සම්පත් මොණරාගල | X | | | 2022/09/14 | දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 11. | ඩී.එම් හර්ෂ ගිහාන් මොණරාගල | X | | | 2022/09/16 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 12. | ඒ. එම් චන්ද්‍රාවති මොණරාගල | X | | | 2022/09/20 | මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 13. | එස්.එම් පියතිලක මොණරාගල | | X | | 2022/09/21 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 14. | ආර්.එච්.එම් ප්‍රසාද් රත්නයක මොණරාගල | | X | | 2022/09/25 | මාර්ග සංවර්ධන අධිකාරිය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී නැත. | වින්දිතයා එම තොරතුරු ඉල්ලීම් ඉදිරියට ගෙන යාමට නොහැකි බව දැන්වීය. | - | - | - |
| 15. | එම්.එච්. එම්නොනා මොණරාගල | X | | | 2022/09/26 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත | - | - | - | - |
| 16. | ඩබ්ලිව්.එම් පියසේන මොණරාගල | | X | | 2022/10/03 | ප්‍රාදේශිය මහ ලේකම් කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 17. | කේ.ජී පියදාස මොණරාගල | | X | | 2022/10/08 | ආරක්ෂක අමාත්‍යංශය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 18. | අංගමුත්තු වීරප්පා සුභාෂිනි මොණරාගල | | X | | 2022/11/09 | පු.ලි.ප.කි. දේපාර්තමේන්තුව | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 19. | එස්. නිමාලි මොණරාගල | | X | | 2022/11/10 | වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 20. | ජී.ඩී.අයි.එම්. නවරත්න මොණරාගල | | X | | 2022/11/16 | තණමල්විල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 21. | ඊ. එම් නිත්‍යා ජීවන්ති මොණරාගල | | X | | 2022/11/28 | වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 22. | කේ. ඒ. ඉසුරු එරන්ද මොණරාගල | X | | | 2022/12/12 | දිස්ත්‍රික් ගොවිජන සේවා කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී නැත | ඔව් | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - |
| 23. | කේ. ඒ. ඉසුරු එරන්ද මොණරාගල | X | | | 2022/12/12 | මර්ග සංවර්ධන අධිකාරිය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී නැත | ඔව් | තොරතුරු ලබා දී නැත | ඔව් | තොරතුරු කොමිසමට අභියාචනය යොමු කිරිමෙන් පසු නම් කළ නිලධාරියා තොරතුරු ලබා දුන් අතර පසුව එය ඉවත් කර ගන්නා ලදී. |
| 24. | එච්. එල්. අචල පියුමන්ත මොණරාගල | | X | | 2022/12/22 | කලාප අධ්‍යාපන කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී නැත. | ඔව් | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 25. | ඒ.එච්.එම්.එන්. කේ අබේසිංහ ආණමඩුව | | X | | 2022/06/13 | කලාප අධ්‍යාපන කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 26. | ඩී.එම් පුංචිබංඩා ආණමඩුව | | X | | 2022/09/25 | ගොවිජන සේවා දෙපාර්තමේන්තුව | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 27. | එම්. සදාසිවම් දෙණියාය | | X | | 2022/06/17 | කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී නැත. | - | - | - | - |
| 28. | ඉන්දුල ඩයස් විජේසේකර මාතර | | X | | 2022.05.11 | වැලිගම ප්‍රාදේශීය සභාව | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 29. | වේල්ලබඩ හේවගේ ධර්මදාස මාතර | | X | | 2022/05/26 | වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 30. | ඉමදුව හේවගේ නන්දසේන මාතර | | X | | 2022/05/27 | ප්‍රදේශීය ලේකම් කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 31. | කේ.පී.වී කල්‍යාණි චන්ද්‍රලතා මාතර | | X | | 2022/05/30 | මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 32. | ඩබ්ලිව්. අනුර මාතර | | X | | 2022/06/22 | මාතර නිවස සංවර්ධන අධිකාරිය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 33. | එම්. ඩබ්ලිව්. අමිතා නිලන්ති මාතර | | X | | 2022/06/24 | මාතර නිවස සංවර්ධන අධිකාරිය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 34. | ඉනෝකා උදයංගනී මාතර | | X | | 2022/07/15 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 35. | ජී.පී. චමින්ද සම්පත් මාතර | | X | | 2022/08/12 | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 36. | ඩබ්ලිව්. රජිතා නියෝමී මාතර | | X | | 2022/09/02 | ප්‍රජා ජල සැපයුම් දෙපාර්තුමේන්තුව | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 37. | දයානන්ද සහබන්දු මාතර | | X | | 2022/09/02 | තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 38. | ඒ. ඩී. දිලිනි මදුමාලි මාතර | | | X | 2022/09/13 | වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 39. | ගල්බොක්ක හේවගේ නිහාල් සිසිර මාතර | | X | | 2022/10/12 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| | | | | | | | | | | | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 40. | එස්. එච්. කුසුමාවති මාතර | | | X | 2022/10/21 | පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව | ප්‍රමාණවත් තොරතුරු ලැබී නොමැත. | - | - | - | - |
| 41. | ආර්. අජිත් ප්‍රියන්ත මාතර | | X | | 2022/11/27 | වැලිගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 42. | එච්. බී. සදුනි මාතර | | X | | 2022/11/28 | වැලිගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 43. | මුනවීර පටබැදිගේ සමන්ති මාතර | | X | | 2022/12/08 | මාතර ප්‍රදේශිය ලේකම් කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 44. | පි.පි ගුණදාස මාතර | | X | | 2022/12/15 | මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ඉල්ලුමකරුගෙන් ප්‍රතිචාරයක් නොමැත. | - | - | - | - |
| 45. | පි. බි. වසන්තා නීලමනි මාතර | | X | | 2022/12/22 | පොලිස් අධිකාරි කර්යාලය | ඉල්ලුමකරුගෙන් ප්‍රතිචාරයක් නොමැත. | - | - | - | - |
| 46. | මහවිදාන තනුජ චමින්ද ඇලෙක්සැන්ඩර් මාතර | | X | | 2022/12/30 | ජාතික තරුණ සේවා සභාව | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 47. | ඇලන් ගමගේ මාතර | | X | | 2023/01/27 | අධ්‍යාපන අමාත්‍යංශය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 48. | ඒ. ජී. දේශිකා ගයනි මාතර | X | | | 2023/01/28 | මාතර ගොවිජන සේවා ආයතනය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 49. | අප්පු කපුගේ නන්දාවති මාතර | | X | | 2023/01/30 | පේරාදෙණිය කෘෂි කර්මාන්ත දෙපාර්තමේන්තුව | ඉල්ලුමකරුගෙන් ප්‍රතිචාරයක් නොමැත. | - | - | - | - |
| 50. | ක්‍රිස්නන් චන්ද්‍රලාල් ගාල්ල | | X | | 2022/06/01 | විදේශ සේවා නියුක්ති කාර්යංශය | ඉල්ලුමකරුගෙන් ප්‍රතිචාරයක් නොමැත. | - | - | - | - |
| 51. | ජී.එච්. සෝමසිරි ගාල්ල | | X | | 2022/06/01 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව අධ්‍යාපන අමාත්‍යංශය | තොරතුරු ලැබී නොමැත. | තොරතුරු ඉල්ලුම්කරු ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොමැත. | - | - | - |
| 52. | පී.එච්.ආර් ප්‍රේමචන්ද්‍ර ගාල්ල | | X | | 2022/06/22 | අධ්‍යාපන අධ්‍යක්ෂක කාර්යාලය | ඉල්ලුමකරුගෙන් ප්‍රතිචාරයක් නොමැත. | - | - | - | - |
| 53. | අරුමප්පෙරුම ආරච්චිගේ සුමනදාස ගාල්ල | | X | | 2022/07/04 | සමුප සංවර්ධන දෙපාර්තමේන්තුව | ඉල්ලුමකරුගෙන් ප්‍රතිචාරයක් නොමැත. | - | - | - | - |
| 54. | මුනිපැල්ල ආරච්චිගේ සරත් ගාල්ල | | X | | 2022/07/04 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | තොරතුරු ලැබී නොමැත. | තොරතුරු ඉල්ලුම්කරු ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොමැත. | - | - | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 55. | වැල්ලාන ගමගේ ධර්මදාස ගාල්ල | | X | | 2022/07/25 | කම්කරු දෙපාර්තමේන්තුව | ඉල්ලුම්කරුගෙන් ප්‍රතිචාරයක් නොමැත. | - | - | - | |
| 56. | දාමුරේ විතානාච්චි පුෂ්පා චන්ද්‍රලතා ගාල්ල | | X | | 2022/09/13 | ගාල්ල තැපැල් කාර්යාලය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව දිසා පාලන කාර්යාලය | ඉල්ලුම්කරුගෙන් ප්‍රතිචාරයක් නොමැත. | - | - | - | - |
| 57. | කේ. සෝමසිරි ගාල්ල | | X | | 2022/10/12 | බිම් සවිය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 58. | වීරමුනි ආරච්චිගේ මාලනී ගාල්ල | X | | | 2022/11/21 | මිනුම්දොරු දෙපාර්තමේන්තුව | තොරතුරු ලැබී නොමැත. | - | - | - | - |
| 59. | ඒ. ඉරේෂා ගංගා කුමරි මැන්දිස් ගාල්ල | | X | | 2022/11/23 | විදේශ සේවා නියුක්ති කාර්යාංශය | තොරතුරු ලැබී නොමැත. | - | - | - | - |
| 60. | පලොල්පිටිය ගමගේ පියසේන ගාල්ල | | X | | 2023/02/24 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 61. | ඒ. එච්. ශාන්ති කුමරි කුරුණෑගල | | X | | 2022/05/31 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | ඉල්ලුම්කරුගෙන් ප්‍රතිචාරයක් නොමැත. | - | - | - | - |
| 62. | එච්. එම් චාන්ද්‍රාවති කුරුණෑගල | X | | | 2022/06/28 | කොබෙයිගනේ ප්‍රදේශීය ලේකම් කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලැබී නොමැත. | - | - | - | - |
| 63. | ඥාණවීර දිසානායක කුරුණෑගල | X | | | 2022/08/08 | මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලැබී නොමැත. | - | - | - | - |
| 64. | දර්ශන අමරතුංග කුරුණෑගල | | | X | 2022/11/03 | සහකාර පොලිස් අධිකාරී කාර්යාලය කුරුණෑගල | ඉල්ලුම්කරුගෙන් ප්‍රතිචාරයක් නොමැත. | - | - | - | - |
| 65. | සරත් පද්මසිරි කුරුණෑගල | | X | | 2023/01/02 | ලංකා බැංකු ප්‍රාදේශිය කාර්යාලය කුරුණෑගල | ප්‍රතිචාරයක් නොමැත. | ඔව් | ප්‍රතිචාරයක් නොමැත. | ඔව් | විමර්ශන සඳහා කැදවා නොමැත. |
| 66. | ඥනවීර දිසානයක කුරුණෑගල | X | | | 2023/01/13 | තැපැල් කාර්යාලය කුරුණෑගල | ප්‍රමාණවත් තොරතුරු ලැබී නොමැත. | ඔව් | ප්‍රමාණවත් තොරතුරු ලැබී නොමැත. | ඔව් | විමර්ශන සඳහා කැදවා නොමැත. |
| 67. | ඥනවීර දිසානයක කුරුණෑගල | | X | | 2023/01/25 | මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලැබී නොමැත. | - | - | - | - |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 68. | නිලන්ති සගරිකා ගම්පහ | X | | | 2022/05/05 | ජාඇල ප්‍රාදේශීය සභාව | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 69. | ජී.ඩී ජගත් පුෂ්පකුමාර ගම්පහ | | X | | 2022/05/05 | ජාතික ජලසම්පාදන | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 70. | නිවුටන් ඩොමිනික් ගම්පහ | | X | | 2022/06/18 | අධ්‍යාපන අමාත්‍යාංශය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී නැත | - | - | - | - |
| 71. | නීතා නෙළුම්දෙණිය අනුරාධපුරය | | X | | 2022/05/10 | තලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 72. | කේ. ජේ. එම් ජයතිස්ස අනුරාධපුරය | X | | | 2022.09.30 | අනුරාධපුර මහ නගර සභාව | අවශ්‍ය තොරතුරු ඔවුන් සතුව නොමැති බවත් ප්‍රදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගන්න ලෙස දන්වා ඇත. | - | - | - | - |
| 73. | කේ. ජේ. එම් ජයතිස්ස අනුරාධපුරය | X | | | | නුවරගම් පලාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 74. | කේ. එම්. චිත්‍රසේන අනුරාධපුරය | | X | | 2022/12/05 | අනුරාධපුර පලාත් අධ්‍යපන කර්යාලය | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |
| 75. | NCDF කන්තලේ | X | | | 2022/12/26 | ඉඩම් අමාත්‍යාංශය LRC | ප්‍රමාණවත් තොරතුරු ලබා දී ඇත. | - | - | - | - |

RIGHT TO LIFE
HUMAN RIGHTS CENTRE

Right to Life human Rights Center
No. 56/2, Palitha Place, Colombo 09, Sri Lanka
Tel/Fax: +94 011 266 9100
Email : right2lifelk@gmail.com
Web : www.right2lifelk.org